**Vidyodaya Journal of Humanities and Social Sciences**

VJHSS (2022), Vol. 07 (02)

# A Study on the Impact of Legal Literacy on Crime Control and Prevention (With Special Reference to Selected Communities in Rathnapura Police Division in Sri Lanka)

R. O. Moorthage* and H. P. K. N. Hewawasam

Department of Criminology and Criminal Justice, University of Sri Jayewardenepura, Sri Lanka

**Article Info**

Article History:
Received 11 Feb 2022
Accepted 17 July 2022
Issue Published Online
01 July 2022

**Key Words:**
Legal Literacy
Legal Empowerment
Legal Comprehension
Legal Knowledge
Crime Control and Prevention

*Corresponding author
E-mail address:
ruby.omaya0908@gmail.com

[https://orcid.org/0000-0003-3314-3844](https://orcid.org/0000-0003-3314-3844)

Journal homepage:
[http://journals.sjp.ac.lk/index.php/vjhss](http://journals.sjp.ac.lk/index.php/vjhss)

[http://doi.org/10.31357/fhss/vjhss.v07i02.09](http://doi.org/10.31357/fhss/vjhss.v07i02.09)

VJHSS (2022), Vol. 07 (02), pp. 120-137

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

CC BY

Faculty of Humanities and Social Sciences 2022

## ABSTRACT

*Self-empowerment and establishing a law-abiding through legal literacy have become a prominent need today. The present study investigates the impact of community awareness on crimes and the feasibility of utilizing it successfully to control and prevent crimes. The research question was Does the level of legal awareness affect the rise of crimes? and Dose the level of legal awareness contributes to Crime control and prevention? The study sample included 82 families out of 1643 families in the Grama Niladhari Divisions in and in the vicinity of the Rathnapura City area. The sample was selected using the Stratified Sampling method and Judgmental Sampling method, and questionnaires were used to collect data, which were analyzed through IBM SPSS 22 version software. The research revealed that the participants are ignorant regarding individual rights and security, crimes and legal nature of crime, and punishments, which made 65% become victims of crimes, and 90% be involved in criminal activities due to inadequate legal literacy. Unawareness of the criminal justice system and its procedure has made 85% of the participants undergo various difficulties. Therefore, the level of legal awareness does affect the control and prevention of crimes significantly. Hence, it is concluded that legal awareness empowers society, and its contribution to personality development lays the foundation for an intelligent community. Therefore, every person must be provided with equal opportunity to improve legal awareness, including law as a school subject and promoting legal awareness as a national policy among the public, victims, social groups, public servants and law-makers contribute to a legally literate society.*

**මාතෘකාව**
නෛතික සාක්ෂරතාව අපරාධ පාලනය හා නිවාරණය කෙරෙහි බලපවත්නා ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (රත්නපුර පොලිස් බල ප්‍රදේශයේ තෝරාගත් සමාජ කණ්ඩායම් කිහිපයක් ඇසුරෙන්)

## 1. හැඳින්වීම

නීතිය පිළිබඳ අවබෝධය යන්න නෛතික සාක්ෂරතාව, නෛතික සවිඥානිකත්වය ලෙසට ද හඳුනාගැනේ. නෛතික සාක්ෂරතාව යන්න පොදු නීති අධ්‍යාපනය යි (Kozhukhova & Zhiyenbayew, 2018). ඒ අනුව නෛතික සාක්ෂරතාව පුද්ගලයන් සවිබල ගන්වයි. එමෙන් ම නෛතික සංස්කෘතියක් ද ගොඩනගයි. මෙය නීති සම්පාදනයට සහභාගී වීම සහ නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීමට උපකාරී වන අතර ම නීතිය හා යුක්තිය පසිඳලීමේ ක්‍රමය හා සම්බන්ධ මහජනතාව දැනුවත් කිරීම සහ කුසලතා ගොඩනැගීම අරමුණු කරගත් ක්‍රියාකාරකම් රාශියකින් සමන්විත වේ. නෛතික සාක්ෂරතාව යන සංකල්පය ප්‍රායෝගික අධ්‍යයන ක්ෂේත්‍රයන්වල දී නීතිය පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩි සමාජීය කැපවීමක් වෙනුවෙන් පෙනී සිටින සමාජ හා වෘත්තීය ව්‍යාපාරයකට යොමු වේ. එනම්, බලපෑම් කණ්ඩායම් තුළින් පවා මෙකී නෛතික සාක්ෂරතාවෙහි අවශ්‍යතාව අවධාරණය කිරීමේ ස්වභාවයක් පවතින බව දක්වයි (Zariski, 1992). ඒ අනුව රටක පවතින නීති පද්ධතිය පිළිබඳ ව ඒ රටේ ජනතාව දැනුවත් වීම අත්‍යවශ්‍ය ය. ජාතියක සමස්ත වර්ධනය හා සංවර්ධනය සඳහා නීති සාක්ෂරතාව වැදගත් ය (Sharma, 2016). නීතිය පිළිබඳ අවබෝධය ජනතාවගේ බුද්ධිමය පිබිදීම් කෙරෙහි සෘජු බලපෑම් දක්වයි. එමෙන් ම අපරාධ යුක්ති ක්‍රමය තුළ අපරාධ පාලනය හා නිවාරණය ප්‍රමුඛත්වෙහි ලා එය ඉහළ කාර්යභාරයක් සිදු කරයි (Ewick & Silbey, 1998). එනම්, ආරක්ෂණයේ වගකීම සහතික කළ වඩාත් යහපත් ගුණාත්මක සමාජ යාන්ත්‍රණයක් තුළ අපරාධ පාලනය හා නිවාරණය ප්‍රමුඛත්වයෙහි ලා සලකනු ලබයි. නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීම රඳා පවතින්නේ අපරාධ වැළැක්වීම සහ සාධාරණ, මානුෂීය සහ වගකිව යුතු අපරාධ යුක්ති විනිශ්චය පද්ධති ප්‍රවර්ධනය කිරීම මත ය. මෙකී ප්‍රවර්ධනය කිරීමේ සැඟවුණු අර්ථය අපරාධ පාලනය හා නිවාරණය යි (The Economic and Social Council resolution Report, 2002). එසේ ම අපරාධ පාලනය හා නිවාරණයෙහි ලා නෛතික සාක්ෂරතාව බලපාන බැවින් ඉහළ නෛතික සාක්ෂරතාවකින් යුක්ත ප්‍රජාවක් ජීවත් වන සමාජයක අපරාධ පාලනය හා නිවාරණය මැනවින් සපුරා ගැනීමට හැකියාව ඇති බව ද විවිධ අධ්‍යයනයන්ට අනුව පැහැදිලි වන කරුණකි (Madhusanka & Hewawasam, 2022).

නීතිය යනු ගැටුම් වළක්වන සමාජීය උපාංගයක් ලෙස ද හඳුනාගත හැකි ය (හරිස්චන්ද්‍ර, 2013). ඒ අනුව එය සමාජයක කළ යුතු යැයි සම්මත වූ හා ඒ හා සමඟ බැඳී පවත්නා වූ සිරිත් විරිත් සමූහයක් හෝ සාම්ප්‍රදායික භාවිතයන් හෙවත් ව්‍යවහාරයන් යැයි කෙටියෙන් හැඳින්විය හැකි ය. මෙසේ සමාජ පාලනයේ මූලධර්මයක් වන නීතිය විධිමත් සමාජ පාලනයක් සඳහා අත්‍යවශ්‍ය අංගයකි. එමෙන් ම යම් දෙයක් හෝ තත්ත්වයක් පිළිබඳ ව ඇති වන අවබෝධය / දැනුම /දැනුවත්භාවය සාක්ෂරතාව ලෙස සරල ව හැඳින්වේ. මෙම අවබෝධය නීතිය සම්බන්ධයෙන් ඇති වීම නෛතික සාක්ෂරතාව යි. නෛතික විධිවිධාන සහ ක්‍රියාවලින් පිළිබඳ ව විචාරාත්මක දැනුම, අයිතිවාසිකම් සහ හිමිකම්වලට ගරු කිරීම හා ඒවා සක්ෂාත් කරගැනීම සඳහා නෛතික දැනුම හා කුසලතා භාවිත කිරීම නෛතික සාක්ෂරතාව ලෙසට හඳුන්වා දිය හැකි ය (Zariski, 1992). Zariski දක්වන පරිදි, නෛතික සාක්ෂරතාව යනු ස්වයං සමාජ බලගැන්වීමේ ක්‍රියාවලියකි (Zariski, 2011). මෙසේ නෛතික දැනුවත්භාවය දීර්ඝකාලීන වශයෙන් සමාජය තුළ ගොඩනැගීමෙන් නෛතික සංස්කෘතිය යන්න නිර්මාණය වේ. නෛතික සංස්කෘතිය යනු සමාජ සංස්කෘතියේ ම කොටසකි. එය නෛතිකමය වශයෙන් පුද්ගල ජීවිතයේ ගුණාත්මක බව ස්ථාවර කරයි. මෙය නෛතික රැකවරණය හා ප්‍රජා ක්‍රියාකාරකම් සහතික කරයි (Kozhukhova & Zhiyenbayew, 2018). එසේ ම නෛතික සාක්ෂරතාව යනු සාමාන්‍ය මිනිසුන්ගේ ජීවිතවල වෙනසක් ඇති කිරීමේ මෙවලමකි. ලොව දියුණු රාජ්‍යයන්හි ජීවත් වන ජනතාව වඩා හොඳ නීති සාක්ෂරතාවකින් යුත් බව ඒ පිළිබඳ වූ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයන්ගෙන් ද පැහැදිලි වේ. නීතිමය විධිවිධාන පුරවැසියන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට උපකාරී වේ. හිටපු ඉන්දියානු අගවිනිසුරු පී. සතාසිවම් වරක් ප්‍රකාශ කර ඇත්තේ, "අපගේ ව්‍යවස්ථාපිත ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම සඳහා නීති සාක්ෂරතාව අත්‍යවශ්‍ය වේ. අධිකරණ පිහිටුවීම ක්‍රියා කරන්නේ සියලු ම මිනිසුන් ඔහුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ව දැනුවත් ය යන උපකල්පනය මත ය" යන්න යි (Sharma, 2016).

නෛතික සාක්ෂරතාව සම්බන්ධයෙන් වඩාත් දියුණු අවබෝධයක් තකා ඒ සම්බන්ධයෙන් න්‍යායාත්මක පැහැදිලි කිරීම් කිහිපයක් පවතී. එනම්, නීතියේ ආධිපත්‍යය පිළිබඳ න්‍යාය - Rule of law, නෛතික සවිඥානිකත්ව න්‍යාය - Legal Consciousness theory (Slibey, 2005), නෛතික බලගැන්වීමේ න්‍යාය - Legal Mobilization (Zariski, 2011), නෛතික සමාජීයකරණය - Legal Socialization ලෙස ය (Zariski, 2011). මෙම න්‍යායාත්මක පැහැදිලි කිරීම් හරහා යෝජිත නෛතික සාක්ෂරතාව හා එහි අවශ්‍යතාව පැහැදිලි ව හඳුනාගත හැකි ය. නෛතික සාක්ෂරතාව බිඳුණු විට අපරාධයක වරදකරුවකු වනවා මෙන් ම එහි ගොදුරක් ද විය හැකි ය.

අපරාධක් යනු අපරාධ නීතියෙන් තහනම් කර ඇති ක්‍රියාවක් වන අතර අපරාධ නිවාරණය අපරාධක් සිදු වීමට ප්‍රථම එය වළක්වාගැනීම සඳහා ගනු ලබන පූර්වාරක්ෂණ ක්‍රියාමාර්ගවලින් යුක්ත වේ.

අපරාධ පාලනය යන්න Crime Control ලෙසත්, අපරාධ නිවාරණය යන්න Crime Prevention ලෙසත් ඉංග්‍රිසි භාෂාවේ ව්‍යවහාර වේ. පසුගිය දශක කිහිපය තුළ බටහිර අපරාධ විද්‍යාව සහ අපරාධ පාලන ප්‍රතිපත්තියේ අපරාධ පාලනය හා වැළැක්වීම වඩාත් වැදගත් මාතෘකාවක් බවට පත් විය. 1990 දශකයේ ආරම්භයේ සිට බටහිර යුරෝපීය රටවල අපරාධ විද්‍යාඥයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, අපරාධ යුක්තිය පිළිබඳ විශේෂඥයින් තුළ අපරාධ පාලනය හා අපරාධ නිවාරණය පිළිබඳව විශාල උනන්දුවක් ඇති වී තිබේ (Mesko, 2009). අපරාධ නිවාරණය යන්න අපරාධ වැළැක්වීම ලෙසත් හැඳින්වේ. එනම්, වළක්වා ගන්නා ආකාරය, වළක්වා ගැනීමට අදාළ නෛතික විධිවිධාන ඇතුළු අනෙකුත් සමාජ ක්‍රියාකාරකම් තේරුම් ගැනීම අපරාධ නිවාරණය යි. අපරාධ පාලනය අපරාධයක් සිදු වීමෙන් අනතුරු ව අපරාධ යුක්තිය ඉෂ්ට කිරීම සඳහා විධිමත් ආයතන විසින් පිළිගන්වනු ලබන ක්‍රියාමාර්ගවලින් යුක්ත වේ (Mesko, 2009). එනම්, අපරාධයක් සිදු වීමෙන් පසු ව ගනු ලබන ක්‍රියාමාර්ග හෙවත් ප්‍රතිචාර දැක්වීම වේ. අපරාධ වැළැක්වීම තුළින් අපරාධ හා අපරාධ හිංසනය වළක්වාලයි. ප්‍රජා ආරක්ෂාව ප්‍රවර්ධනය කරයි. රටවල තිරසර සංවර්ධනයට දායක වෙයි. සමාජ ආරක්ෂණයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරයි. සියලු පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවයි. එය විධිමත් අපරාධ යුක්ති පද්ධතිය හා සම්බන්ධ පිරිවැය අඩු කිරීම මෙන් ම අපරාධ හේතුවෙන් ඇති වන වෙනත් සමාජ වියදම් ද අඩු කරයි' (Economic and Social Council, 2002). අපරාධ වැළැක්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අත්පොත - 2004 දක්වනුයේ, " Prevention is the first imperative of Justice" (Handbook on the crime prevention guidelines United Nation Document/S, 2004,) එනම්, 'යුක්තියේ ප්‍රථම අවශ්‍යතාව වැළැක්වීම' ලෙස ය. " ප්‍රතිකාර කිරීමට වඩා වළක්වා ගැනීම හොඳ ය" යන්න අපරාධ නිවාරණයේ පිළිගැන්ම යි. එමෙන් ම අපරාධ නිවාරණය පිළිබඳ සමාජ සංවර්ධනාත්මක එළැඹුම - Social development Crime Prevention approach, අපරාධ නිවාරණය පිළිබඳ ආවස්ථික එළැඹුම - Situational Crime Prevention approach, අපරාධ නිවාරණය පිළිබඳ පාරිසරික එළැඹුම - Enviromental Crime Prevention approach සහ ප්‍රජා පාදක අපරාධ නිවාරණ එළැඹුම - Community Base Crime Prevention approach යනු අපරාධ නිවාරණය පිළිබඳ අධ්‍යයනවලට අනුව ගොඩනැඟුණු අපරාධ විද්‍යාත්මක එළැඹුම් කිහිපයකි.

ඒ අනුව මූලික වශයෙන් සමාජයේ ජනතාවගේ මූලික අවශ්‍යතා සහ ඔවුන් සමාජ පාර්ශ්වයක් ලෙස ජීවත් වීමට ඉෂ්ට කළ යුතු සියලු සමාජ අවශ්‍යතා ප්‍රශස්ත මට්ටමින් ඉෂ්ට වන ආකාරයට රටේ ආර්ථිකය මෙන් ම සමාජ ව්‍යුහය ගොඩනැඟීම අපරාධ නිවාරණය පිළිබඳ සමාජ සංවර්ධනාත්මක එළැඹුම තුළින් අවධානය යොමු කරන අතර මෙහි දී අදාළ ඉලක්කගත කණ්ඩායම් කල් තියා ම ආමන්ත්‍රණය කිරීමත්, එයට පිළියම් යෙදීමත් සමාජ සංවර්ධනාත්මක එළැඹුම අරමුණු කරගනී. එමෙන් ම ආවස්ථික එළැඹුමේ දී වඩාත් අවධාරණය කරනු ලබන්නේ අපරාධ කිරීමට ඇති ඉඩ ප්‍රස්තාවන් අඩු කිරීමටත්, අපරාධ කිරීමට යොමු වන පුද්ගලයන් මහත් අවධානමක් ගන්නා ආකාරයට අපරාධයක් සිදු කිරීමේ අවදානම් සාධක ඉහළ දැමීමත්, අපරාධවලින් ලැබිය හැකි ප්‍රතිලාභ ඇත්නම් එම ප්‍රතිලාභ අවම කිරීමත් කෙරෙහි ය (UNODC, 2010). පාරිසරික එළැඹුම වැදගත් වන්නේ, පාරිසරික සැලසුම්කරණය මඟින් අපරාධ නිවාරණය ඇති කිරීම ය. විශේෂයෙන් පාරිසරික සැලසුම්කරණය හරහා අපරාධ වැළැක්වීම - Crime Prevention Through Environment Design (CPTED) පිළිබඳ ව 1961 වර්ෂයේ දී, ජෝන් ජේකොබ්ස් නම් කතුවරිය විසින් රචිත 'The Death and Life of Great American Cites' නම් කෘතිය හරහා මුල් වරට පාරිසරික සාධක මාර්ගයෙන් අපරාධ නිවාරණය ගෙනහැර දක්වන ලදි (Kim & Park, 2020, 05). ප්‍රජාව පාදක කොටගත් අපරාධ නිවාරණයේ දී ඉලක්ක වන්නේ විවිධ ප්‍රජාවන් සහ ඔවුන් වාසය කරන ප්‍රදේශ ආදිය යි. මෙහි දී පුද්ගලයන් ඉල වෙනුවට අපරාධවලට සම්බන්ධ විමේ හෝ ගොදුරු බවට පත්විමේ අවධානම ඉහළ මට්ටමක පවතින ප්‍රදේශ ඉලක්ක කරමින් අපරාධ නිවාරණ වැඩසටහන් සම්පාදනය කෙරේ (UNODC, 2010).

නෛතික සාක්ෂරතාව අපරාධ වර්ධනය, අපරාධ වින්දිතභාව හා අපරාධ පාලනය හා නිවාරණය කෙරෙහි කරනු ලබන බලපෑම සම්බන්ධයෙන් ලොව බොහොමයක් සමාජීය විද්‍යා පර්යේෂකයන්ගේ අවධානය යොමු ව ඇත. Bevan, විසින් 2013 වර්ෂයේ දී සිදු කරන ලද අධ්‍යයනයකට අනුව අනාවරණය වූයේ යෞවන යෞවනියන් අතර පවතින අපරාධ යුක්ති ක්‍රියාපටිපාටිය සම්බන්ධ නො දැනුවත්කමින් පසු වීම පොලිසිය වැනි ආයතනවලත්, ඔවුන්ගේ අයිතිවාසිකම් හිමි වීම සම්බන්ධයෙනුත් අසාධාරණකම්වලට ලක් වීමේ අවදානමක් පවතින බවයි (Bevan, 2013). එමඟින් තහවුරු වූයේ, රටේ නීතිමය තත්ත්වයන් පිළිබඳ ව තරුණ පිරිස් අතර පවතින දැනුම අවම බවත්, එකී නො දැනුවත්කම බොහෝ දුරට මත්ද්‍රව්‍ය භාවිතයන් සඳහා ගොදුරු වීම, අපරාධ සිදු කිරීමෙහි ලා පෙළඹීම, අපරාධ යුක්ති ආයතනවල අසාධාරණකම්වලට ලක් වීම යනාදිය කෙරෙහි බලපා ඇති ආකාරය පැහැදිලි කරයි (Bevan, 2013). එමෙන් ම අපරාධ යුක්ති පද්ධතිය පිළිබඳ ව මහජන දැනුම හා විශ්වාසය මැනීමේ පර්යේෂණයක් නිකොලා මාර්ෂ් ඇතුළු පර්යේෂණ කණ්ඩායම විසින් ද සිදු කරන ලදි . පවතින අපරාධ යුක්ති ක්‍රියාපටිපාටිය හා එහි නෛතිකමය තත්ත්වයන් සම්බන්ධයෙන් සහභාගිවූවන්ගෙන් 60%ක පමණ

පිරිසකට ඇත්තේ අඩු අවබෝධයක් බවට එහි දී අනාවරණය විය (Marsh, McKay, Pelly, & Cereda, 2019). Elena Pevtsova, 2013 ළමයින් හා තරුණයන්ගේ නීතිමය දැනුවත්භාවය පාසල් කේන්ද්‍ර කරගනිමින් අධ්‍යයනය කර ඇත. ඔහුගේ නිගමනය නම් ශිෂ්‍යයන්ගේ නෛතික දැනුවත්භාවය ඔවුන්ගේ අනාගතය නිර්මාණය වීම කෙරෙහි බලපානු ලබන බව යි. සමාජය තුළ දරුවා සට්ටනය වීමේ දී මෙකී දැනුවත්භාවය යන්න අත්‍යවශ්‍ය ය. සාමාන්‍ය සමාජයේ සිරිත්-විරිත් සංස්කෘතින්ට අමතර ව යම් සිදුවීමක් අපරාධයක් වන බවට පවතින නීතිමය දැනුම අවම ය. සමාජ අපරාධ වැළැක්වීමේ දී නෛතික සාක්ෂරතාවේ මට්ටම ඉහළ නැංවිය යුතු බවට ද ඔහු දක්වන ලදි (Pevtsova, 2013).

මහජනතාවගේ නීතිය පිළිබඳ ව දැනුවත්භාවයේ සමීක්ෂණයක් කොරියාවේ නීති පරීක්ෂණ ආයතනයක් විසින් 2015, Hyeon Dae-Ho සිදු කරන ලදි. කොරියාව තුළ ජනතාවගේ බුද්ධි මට්ටමේ දියුණුවත් සමඟ යහපත් මට්ටමක නෛතික සාක්ෂරතාවක් පවතින බවට තහවුරු විය. ඒ අනුව කොරියානු ජනතාවගේ විනයානුකූලභාවය කෙරෙහි නෛතික සාක්ෂරතාවෙන් යුත් බව බෙහෙවින් බලපා ඇති බවට කියැවේ (Dae-Ho, 2015). Candace Mirabile, 2013 දක්වන ආකාරයට ගුරුවරුන් සහ උපසමූහයන් කීපයක් අතර නෛතික සාක්ෂරතාවේ තරම පිළිබඳ ව සංසන්දනාත්මක අධ්‍යයනයක් ද සිදු විය. එමෙන් ම Cedric Michel ඇතුළු පිරිස සුදු කරපටි අපරාධ පිළිබඳව මහජන අදහස් සහ අවබෝධය මැනීම තුළින් අපරාධ නිවාරණය කර ගැනීමේ මාර්ග සලකා බැලීමේ පර්යේෂණයක් 2005 සිදු කරන ලදි (Mirabile, 2013; Michel, Cochran, & Heide, 2015).

Farihan Farouk Helmy ඇතුළු පර්යේෂණ කණ්ඩායම සෞදි අරාබියේ තායිෆ් කලාපයේ පවතින ළමා අපචාර හා ඒවා නො සලකා හැරීමත්, එය නීති විරෝධී ක්‍රියාවක් බවටත් මව්වරුන් අතර පවතින දැනුම පිළිබඳවත් මැන බලන ලදි. තව ද Farhiya Mweys Muse ගේ පර්යේෂණාත්මක අධ්‍යයනයක් වූයේ, ළමා ලිංගික අපයෝජනයන් පිළිබඳව විශ්වවිද්‍යාල සිසුන් අතර පවතින දැනුම තෝරාගත් ශිෂ්‍යයන් ඇසුරෙන් අධ්‍යයනය කිරීම ය. 2016, Ben Mathews සහ Delphine Collin-Vezina යන අය ළමා ලිංගික අපයෝජන පිළිබඳ ව සමාජ දැනුවත්භාවය හා සංවේදීතාවේ මට්ටම පරීක්ෂා කිරීමක් සිදු කරන ලදි. ඊජිප්තුවේ Menoufiya විශ්වවිද්‍යාලය සිසුන් අතර ලිංගික හිංසනයන් පිළිබඳ දැනුවත්භාවයක් සහ ඔවුන් ඒ සම්බන්ධයෙන් ලබා ඇති අත්දැකීම් පිළිබඳ 2020, Hala Marawan සහ Dalia El-Sayed ගවේෂණාත්මක පර්යේෂණක් සිදු කර ඇත. මෙම අධ්‍යයනයන් සියල්ල මගින් නිශ්චය වූ පොදු කාරණාව වූයේ, සමස්තයක් ලෙස ලිංගික අපරාධයන් සම්බන්ධ නෛතිකමය අවබෝධයේ දුර්වලතාවක් පවතින බව ය. අපරාධමය ගැටලු පාලනය සඳහා වන පළමු පියවරක් ලෙස ප්‍රජාව අතර අපරාධ නීති කාරණා සම්බන්ධ දැනුවත්භාවය ව්‍යාප්ත කළ යුතු බව මෙම සෑම පර්යේෂණයකින් ම දක්වා ඇත. එමෙන් ම අධ්‍යයන සඳහා ඉලක්කගත වූ එකිනෙක කණ්ඩායම් ඔවුන්ගේ සමාජ තත්ත්වයන් අනුව දැනුවත්භාවයේ අඩු-වැඩි වීමක් පැවතිණි (Muse, 2013; Mathews & Collin-Vezina, 2016; Helmy, 2017; Marawan, & El-Sayed, 2020). නෛතික සාක්ෂරතාව පිළිබඳ ව මෙතෙක් සිදු කර ඇති පර්යේෂණ අධ්‍යයනයන් සියල්ල නිශ්චිත එක් අපරාධයක් සම්බන්ධයෙන් පමණක් නෛතික සාක්ෂරතාවය මැනීම සිදු කර ඇත. එහි දී නෛතික සාක්ෂරතාව තුළින් අපරාධ පාලනය හා නිවාරණයේ ගොඩනැඟීම කෙරෙහි ප්‍රබල අවධානයක් යොමු කර නොමැති බව ප්‍රබල ශාස්ත්‍රීය හිඩැසක් පෙන්නුම් කරයි. ඒ අනුව පුළුල් විෂය පරාසයක් ආවරණය කරමින් සමස්තයක් ලෙස නෛතික සාක්ෂරතාවය අපරාධ පාලනය හා නිවාරණය කෙරෙහි බලපැවැත්වීම යන ශාස්ත්‍රීය හිඩැස සපුරාලයි.

අපරාධ පිළිබඳ අධ්‍යයනය සාම්ප්‍රදායික ව සමාජ විද්‍යාව මෙන් ම අනෙකුත් විෂයයන්වල ද සංරක්ෂණය වී ඇති අතර සංවර්ධනය වෙමින් පවතින සියලු රටවල සිදු වන පරිවර්තනයන් හේතුවෙන් අපරාධමය සිදුවීම් අනුපාතය ද ඉහළ යමින් පවතී (Rathnayaka, 2015). ගෝලීය වශයෙන් දිනෙන් දින ඉදිරි ගමනක නිරත වන ශ්‍රී ලාංකේය ජනයාට නෛතික සවිඥානිකත්වයෙන් සාර්ථක සමාජ බිහි වීමක් සඳහා අත්‍යවශ්‍යයක් සාධකයක් බව පෙනෙන අතර නමුත් ශ්‍රී ලංකාව තුළ ඒ සඳහා වූ නිසි අත්තිවාරමක් නොමැත. ද්වීතීයික හා තෘතීයික පාසල් අධ්‍යාපනයන් තුළ නීතීගරුක සමාජයක් සඳහා වූ මූලික නීති සිද්ධාන්ත හෝ ව්‍යවහාරික දැනුම ලබා නො දෙනවා මෙන් ම විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පවා නීති අධ්‍යාපනය සීමිත විෂය පාඨමාලාවන් සඳහා පමණක් සීමා වී ඇති බැව් අත්දැකීමෙන් දනිමු. රටක පුරවැසියන් එරට නිතියේ මූලික මූලධර්ම පිළිබඳ ව දැනුවත් විය යුතු ය. මෙය සාක්ෂාත් කර ගැනීමට ඇති හොඳ ම සහ පහසුම ක්‍රමය වන්නේ පාසල් විෂය මාලාවට මූලික නීති විෂයය ඇතුළත් කිරීම යි. නීති අධ්‍යාපනය තවමත් ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවේ කොටසක් නො වේ (Kulathunga, 2021). එය ශ්‍රී ලංකාව තවමත් පසුගාමී මට්ටමක පවතින බව තහවුරු කරන්නකි.

එනම්, බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට නීති අධ්‍යාපනය වෘත්තීමය වශයෙන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ නීති පීඨය මගින් සහ නිබන්ධමය මූලික පර්යේෂණ උපාධි ලෙස 1948 දී විධිමත් ක්‍රමවේදයකින් ආරම්භ කරන ලදි (Cooray, 1975). නිදහසින් පසු දශක ගණනාවක් පසු කර ඇති නමුත්, ශ්‍රී ලංකාව තවමත් හුදෙක් වෘත්තීමය තත්ත්වයෙන් ඔබ්බට සාමාන්‍ය ජනතාව අතර නෛතික සවිඥානිකත්වය ගෙන යාමට සමත් නො වීම ඛේදාන්විත තත්ත්වයකි.


ඒ බව තවදුරටත් තහවුරු කරමින් Tripathi, 1968 සහ Maxwell, 1975 තම පර්යේෂණවලින් දක්වනුයේ, ලෝකය දියුණු වන කාල පරාසයක නීති අධ්‍යාපනය සමාජගත කිරීම අධ්‍යාපනඥයින්ගේ වගකීමක් බව යි (Tripathi, 1968; Maxwell, 1975). එමෙන් ම පාසල් අධ්‍යාපනය තුළ නීතිය ඉගැන්වීමේ ක්‍රියාකාරකම් සැලසුම් විය යුතු ආකාරය සම්බන්ධයෙන් Kashyap, 2016 අදහස් දක්වා ඇත (Kashyap, 2016).

ඒ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණ අරමුණ වශයෙන් පුද්ගල අයිතිවාසිකම් හා ආරක්ෂාව සම්බන්ධ දැනුවත්භාවය හඳුනාගැනීම, අපරාධ ගොදුරුකරණය හා සම්බන්ධ සවිඥානිකත්වය අධ්‍යයනය කිරීම, අපරාධ යුක්ති ක්‍රමය හා එහි ක්‍රියාපටිපාටිය පිළිබඳ දැනුවත්භාවය හඳුනාගැනීම, අපරාධමය වැරදිවලට හිමි දඬුවම් පිළිබඳ දැනුවත්භාවයේ මට්ටම අධ්‍යයනය කිරීම යන කාරණා තුළින් ඉස්මතු වන නෛතික සාක්ෂරතාව අධ්‍යයනය කිරීම හරහා අපරාධ පාලනය හා නිවාරණයේ ශක්‍යතාව අනාවරණය කිරීම හා එකී දැනුවත්භාවය පුද්ගල, ආර්ථික හා අධ්‍යාපනික, මට්ටම් අනුව වෙනස් වීමේ තත්ත්වය අධ්‍යයනය කිරීම යන්න යි. එහි දී සමාජ ආරක්ෂණයේ ගුණාත්මකභාවය සහතික කරගත් නෛතික සංස්කෘතියක් සහිත නීතිගරුක සමාජයක් ගොඩනැංවීමේ අවශ්‍යතාව පෙන්නුම් කිරීම සහ නෛතික සාක්ෂරතාව සහ අපරාධ අතර සහසම්බන්ධතාව අවධාරණය කිරීම යනාදී කාරණා ඉස්මතු කිරීම තුළින් යථාර්ථවත් කිරීමට අපේක්ෂා කෙරේ.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

### 2. 1 සංකල්පීය රාමුව

සංකල්පීය රාමුවෙහි දැක්වෙන ආකාරයට අධ්‍යයන පරායත්ත විචල්‍යය වන නෛතික සාක්ෂරතාවෙන් සැපිරීම සඳහා හේතු වන මානයන් (Dimensions) වන දඬුවම් හා සම්බන්ධ දැනුවත්භාවය, අපරාධ යුක්තික්‍රමය හා එහි ක්‍රියා පටිපාටිය පිළිබඳ දැනුවත්භාවය, අපරාධ ගොදුරුකරණය හා සම්බන්ධ දැනුවත්භාවය, පුද්ගල අයිතිවාසිකම් සහ ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය යන මානයන්ගෙන් යුක්ත විය යුතු විවිධ පර්යේෂණයන්ගෙන් අවධාරණය කොට ඇත (Dae-Ho, 2015 ; Helmy, 2017, Marsh and et.al., 2019). ඒ අනුව මෙම අධ්‍යයනයේ ද නෛතික සාක්ෂරතාව යන්න ඉහත මානයන්ගෙන් යුක්ත විය යුතු බව අදහස් කරනු ලබයි. එසේ ම නෛතික සාක්ෂරතාව පුද්ගල අධ්‍යාපන මට්ටම හා ආදායම් මට්ටම අනුව වෙනස් වන ආකාරය හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ සහ මූලික අධ්‍යයනයේ දී මූලික වශයෙන් අවධාරණය කරන බැවින් අධ්‍යාපන හා ආර්ථික මට්ටම යන්න ස්වායත්ත විචල්‍යයන් ලෙස යොදාගනු ලබයි. මෙම පර්යේෂණය කලුතර හා කොළඹ දිස්ත්‍රික්ක ආශ්‍රයෙන් සිදුකරනු ලැබීය. සමස්ත නියැදිය 315ක් වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 2015-2020 දක්වා ළමා ලිංගික අපයෝජනය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි 948 කින් විවිධ හේතු නිසා (අසත්‍ය පැමිණිලි, විමර්ශනය වෙමින් පවතින පැමිණිලි සහ වයස අවුරුදු 50 අඩු ළමයි සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි) පැමිණිලි 581 ක් ඉවත් කළ පසු සංගහණය වන 367 කින් 228 ක් වන නියැදිය තෝරාගන්නා ලදී.




**රූපසටහන 1.** සංකල්පීය රාමුව

## 2.2 අධ්‍යයන ප්‍රදේශය

රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ නගරාශ්‍රිත ග්‍රාම නිලධාරි වසම් කිහිපයක් අධ්‍යයන ප්‍රදේශ වශයෙන් යොදා ගනිමින් මෙම පර්යේෂණය සිදු විය. රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විශාලත්වය මෙන් ම පර්යේෂණයේ පහසුව ද අවධාරණය කරමින්, රත්නපුර නගරය ආශ්‍රිත ග්‍රාම නිලධාරි වසම් 03ක් අධ්‍යයනය සඳහා කේන්ද්‍ර විය.

- රත්නපුර නගරය 152 A
- රත්නපුර නගරය උතුර 152 E
- රත්නපුර නගරය බටහිර 152 F

මෙම නගරාශ්‍රිත ප්‍රදේශ තෝරාගැනීමට බලපානු ලැබූ ප්‍රධාන සාධකය නම්, සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ සිදු වන අපරාධ අතර රත්නපුර දිස්ත්‍රික්කය සැලකිය යුතු ස්ථානයක් හිමි කරගෙන තිබීම ය. එනම්, වර්ෂ 2019 පොලිස් දත්ත වාර්තාවන්ට අනුව 2019 දී මෙරට අපරාධමය සිදුවීම් 34578ක් වාර්තා වී ඇත. ඒ අතුරින් 1417ක සිදුවීම් ප්‍රමාණයක් වාර්තා වනුයේ රත්නපුර දිස්ත්‍රික්කයේ ය. ඒ අනුව රත්නපුර පොලිස් බල ප්‍රදේශයේ බහුල වශයෙන් අපරාධ සිදු වන ප්‍රදේශ නොහොත් ග්‍රාම නිලධාරි වසම් සැලකිල්ලට ගනිමින් අධ්‍යයනය සිදු විය. ඉහත ග්‍රාම නිලධාරි වසම් තුළ ප්‍රධාන වශයෙන් ආර්ථිකය සහ එයට සමගාමී ව අධ්‍යාපනය යන අංශයන් තුළ සමාජ ස්තර කිහිපයක් යොදා ගනිමින් අධ්‍යයනය සිදු විය.

එමෙන් ම පර්යේෂණ අධ්‍යයනය විද්‍යාත්මක ව හා ක්‍රමවත් ව සිදු කිරීම පිණිස තෝරාගත් නියැදි ක්‍රමය වනුයේ, ස්තරායන නියැදි ක්‍රමය (ස්තරභූත සසම්භාවි) හා විනිශ්චයගත නියැදි ක්‍රමය යි. ඉහත රත්නපුර නගරාශ්‍රිත ග්‍රාම නිලධාරි වසම් 03 තුළ පවුල් 1643ක් ජීවත් වෙයි. එහි දී රත්නපුර නගරය - පවුල් 389ක්, රත්නපුර නගර උතුර - පවුල් 921ක්, රත්නපුර නගර බටහිර - පවුල් 333ක් වශයෙන් අධ්‍යයන ප්‍රදේශයේ කුටුම්භ කේන්ද්‍ර කරගනිමින් නියැදිය සහ නියැදි ප්‍රදේශ තෝරාගන්නා ලදි. අධ්‍යයන ප්‍රදේශයේ කුටුම්බ ආර්ථික මට්ටම් අනුව ස්තරායන නියැදි ක්‍රමය (ස්තරභූත සසම්භාවි) යටතේ විභේදනය කරමින් නියැදි තරම 5%ක ප්‍රතිශතයකින් ලබා ගන්නා ලදි. එහි දී ලැබූ නියැදි තරම විනිශ්චයගත නියැදි ක්‍රමය යටතේ තෝරාගනු ලැබී ය.

ඒ අනුව අධ්‍යනයේ **N= සංගහනය - 1643කි.**

**n= නියැදිය - 82කි.**

$$N \times \frac{5}{100} = n$$

$$1643 \times \frac{5}{100} = 82.15 = 82$$

අධ්‍යයනයේ දී ප්‍රශ්නාවලී ක්‍රමය මගින් දත්ත ලබාගත් අතර ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණයේ දී, ප්‍රධාන වශයෙන් සමාජීය විද්‍යාවන් සඳහා වන සංඛ්‍යානමය මෘදුකාංගය - IBM SPSS 22 භාවිත කරමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි. එමෙන් ම Ms Excel භාවිතය සහ වගු සටහන්, ප්‍රස්තාර භාවිතය ද සිදු විය. SPSS ක්‍රමවේදය හරහා දත්ත විශ්ලේෂණයේ දී දර්ශක ගොඩනැගීම - Index, Crosstabulations විශ්ලේෂණය, සංඛ්‍යාත්මක වගු භාවිතය - Frequency Table යන විශ්ලේෂණ ආකාර ප්‍රධාන වශයෙන් යොදා ගන්නා ලදි. එමෙන් ම පර්යේෂණයේ දී පර්යේෂකයාගේ අවධානයට යොමු වන සංඛ්‍යාත්මක ව දැක්වීමට අසීරු කරුණු එනම්, ජීවන තත්ත්වයන් / සමාජ තත්ත්වයන් / අත්දැකීම් යනාදි දත්තයන් සංඛ්‍යාත්මක ව දැක්වීමට අපහසු කල්හි ඒවා ගුණාත්මක දත්ත විශ්ලේෂණය හරහා ඉදිරිපත් කරනු ලැබී ය.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 ජීව දත්ත විශ්ලේෂණය

රත්නපුර නගරය - 23%, රත්නපුර නගරය උතුර - 56%, රත්නපුර නගරය බටහිර - 21% වශයෙන් දත්ත දායකයින් සහභාගිකරගනිමින් මෙම අධ්‍යයනය සිදු විය. නියැදි දැක්වීම අනුව සහභාගිවූවන්ගෙන් සමාජ කණ්ඩායම් විභේදනය කිරීම පවුලේ මාසික ආදායම අනුව සිදු කරන ලදි. එසේ සිදු කිරීම සමාජ තත්ත්වය පිළිබඳ හඳුනාගැනීමට නිර්ණායක් වශයෙන් යොදා ගන්නා ලදි. එනම්, ඒ ඒ ප්‍රදේශ අනුව සහභාගිවූවන්ගෙන් සමාජ කණ්ඩායම් විභේදනය කිරීම පවුලේ මාසික ආදායම අනුව සිදු කරන ලදි. මෙම විභේදනය සම්පත් පැතිකඩ දත්ත වාර්තාවන්ට අනුකූල ව සිදු විය.

- රු. 1000 සිට 10,000 දක්වා - අඩු ආදායම්ලාභීන්
- රු. 10,001 සිට 50,000 දක්වා - මධ්‍යම ආදායම්ලාභීන්
- රු. 50,001 සහ ඉහළ - ඉහළ ආදායම්ලාභීන් (සම්පත් පැතිකඩ, 2018, 2-80).

ලෙස හැම සමාජ ක්ෂේත්‍රයක් ම ආවරණය වන පරිදි සහභාගි වූ දත්ත දායකයන් ඔවුන් ඔවුන්ගේ පවුලේ මාසික ආදායම වගු අංක 01 හි දැක්වේ.

**වගු අංක 1.** පවුලේ මාසික ආදායම

| **පවුලේ මාසික ආදායම** | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 10,000 අඩු | 14 | 17.1% |
| 10,001 - 50,000 අතර | 54 | 65.8% |
| 50,001 සහ ඉහළ | 14 | 17.1% |
| **එකතුව** | **82** | **100%** |

එමෙන් ම සහභාගි වූ දත්ත දායකයන්ගෙන් ස්ත්‍රීන් 56%ක් සහ පුරුෂයින් 44%ක් විය. දත්ත දායකයින්ගෙන් වයස අවුරුදු 19 - 25ත් අතර තරුණ පිරිස් සමස්තයෙන් 29% ප්‍රතිශතයකින් ද, වයස අවුරුදු 26 - 32ත් අතර 27%ක් සහ එමෙන් ම අර්ධ මැවිය සහ මැදිවිය නියෝජනය කරමින් 37% දෙනෙක් ද පාසල් සිසුන් 6 දෙනෙක් ද සහභාගි විය. ජන වර්ගය අනුව ගත් විට බහුතරයක් සිංහල ජනවර්ගය නියෝජනය කරමින් 67ක පිරිසක් සහභාගි වූ අතර, දමිළ 11ක් සහ මුස්ලිම් 4ක් වශයෙන් අනෙකුත් ජනවර්ගයන්ගේ සුළු නියෝජනයක් ද විය. එමෙන් ම සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබූ දත්තදායකයන් ප්‍රතිශතයක් වශයෙන් 42.7%කි. උසස් පෙළ දක්වා 29.3%ක් ද ඩිප්ලෝමාධාරී සහ වෘත්තීය පුහුණුධාරීන් 8.5% බැගින් විය. උපාධිය දක්වා 9.8 %ක් ද පශ්චාද් උපාධි හෝ ඉහළ අධ්‍යාපනය ලැබූවන් 1.2 % වශයෙන් ද අධ්‍යයනය සඳහා සහභාගි විය. දත්තදායකයින් නියුතු වෘත්තීන් පිළිබඳ ව සලකා බැලීමේ දී වෘත්තීන් 19ක් නියෝජනය කරන පිරිස් මෙහි විය.

### 3.2 පුද්ගල අයිතිවාසිකම් සහ ආරක්ෂාව පිළිබඳ ව දැනුවත්භාවය

අපරාධ නීතිය සම්බන්ධ දැනුවත්භාවයෙහි ලා පුද්ගල අයිතිවාසිකම් හා ආරක්ෂාව සම්බන්ධ අවබෝධය හඳුනාගැනීම මෙමඟින් සිදු විය.
ඒ අනුව අපරාධ නීතිය මගින් පුද්ගලයෙකුට ලබා දී ඇති මූලික ආරක්ෂාවන් සහ ක්‍රමෝපායන්, අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත්භාවයේ තරම මැනීම දර්ශකයක් ගොඩනැගීම මගින් සිදු විය. ඒ අනුව ප්‍රථමයෙන් පුද්ගල අයිතිවාසිකම් සහ ආරක්ෂාව පිළිබඳ ව දත්තදායකයන් ලබා දුන් දත්තවල සංගතභාවය මැනීම සිදු විය. එහි දී KMO සහ Bartlett ගේ පරික්ෂණයට අනුව 0.599කින් යුක්ත මෙම පරික්ෂණ 0.5ට වඩා විශාල බැවින් දත්ත සංගතභාවයෙන් යුක්ත වේ. එබැවින් පුද්ගල අයිතිවාසිකම් සහ ආරක්ෂාව පිළිබඳ ව දැනුවත්භාවය සම්බන්ධයෙන් දර්ශකයක් ගොඩනැගීමේ හැකියාව මෙම අධ්‍යයනයේ පවතී. එමෙන් ම දර්ශකය සඳහා යොදාගත් දත්තවල විශ්වසනීයභාවය මැනීමේ දී ඇල්ෆා අගය 0.462ක් වන අතර එමගින් දත්තවල විස්වසනීයත්වය ද තහවුරු වේ.

රූපසටහන 02 හි සඳහන්වන පරිදි දත්තදායකයින් පුද්ගල අයිතිවාසිකම් සහ ආරක්ෂාව සම්බන්ධයෙන් තමා ඉතා හොඳින් දැනුවත් බවට පිළිගනු ලබයි. එකී පිළිගැනීම ප්‍රායෝගික තලය තුළ කෙතරම් දුරට සාර්ථකදැයි විමසා බැලීම අධ්‍යයනයේ වැදගත් අංගයක් විය. ඒ අනුව ඔවුන් තමා දැනුවත් බවට දක්වන නමුත් සත්‍ය දැනුවත්භාවයක් පවතින්නේ ද යන්න සම්බන්ධයෙන් සිදු කළ පරික්ෂණාත්මක ප්‍රශ්න සඳහා දැක්වූ නිවැරදි පිළිතුරු ප්‍රමාණයට අනුව ජනතාව තමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත් බවට උපකල්පනය කරනුයේ අවිධිමත් ආකාරයෙන් ලබාගත් සුළු දැනුම මතය බව නිගමනය විය. එසේ සිදු කළ එක් පර්යේෂණාත්මක පැහැදිලි කිරීමක් වන්නේ අයිතිවාසිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් පැමිණිලි කළ හැකි ආයතන පිළිබඳ ව දැනුවත්භාවය කෙසේ ද යන්න මැන බැලීම යි. එහි දී තමා ඉතා හොඳින් අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත් බවට දක්වන කුටුම්බ 17 අතුරින් සත්‍ය දැනුවත්භාවකින් යුක්ත වන්නේ කුටුම්බ 03ක් පමණි. එමෙන් ම ඉහත දී දැනුවත් බවට දැක්වූ කුටුම්බයන්ගේ සත්‍ය දැනුවත්භාවය පරික්ෂා කිරීමේ දී ද ඔවුන්ගේ දැනුවත්භාවයේ දුර්වලතාවන් පවතින බවට සනාථ විය.


ඒ අනුව දැනුවත්, හොඳින් ම දැනුවත්, සහ නො දැනුවත්, කිසිසේත් නො දැනුවත් ලෙස ප්‍රකාශ සටහන් කළ කුටුම්බයන් අතුරින් තරමක් දැනුවත් කුටුම්බයන්ගේ ඉහළ යෑමක් පෙන්නුම් කරන අතර මෙහි දී අවබෝධයට ගත යුතු කාරණයක් වනුයේ පොදු සමාජීය කාරණාවලී මෙන්ම අවිධිමත් දැනුවත් වීම් මගින් මඳ වශයෙන් පුද්ගල අයිතිවාසිකම් සම්බන්ධයෙන් අවබෝධයක් ඇති වූව ද එකී දැනුවත්විම නෛතික සමාජ ගොඩනැංවීමකට ප්‍රමාණවත් නො වන බව යි.

**වගු අංක 2.** පුද්ගල අයිතිවාසිකම් සහ ආරක්ෂාව පිළිබඳ දත්තවල සංගතභාවය මැනීම

| KMO සහ Bartlett ගේ පරික්ෂණය (KMO and Bartlett's Test) | | |
|---|---|---|
| නියැදියේ ප්‍රමාණවත් බව පිළිබඳකේසර් මේයර් ඔල්කින්ගේ මිනුම | | .599 |
| Bartlett's Test of Sphericity | කයි වර්ග පරීක්ෂණ සංඛ්‍යාතිය (Approx. Chi-Square) | 45.177 |
| | සුචලතාංක ගණන (Df) | 10 |
| | වෙසෙසියාත්මකබව (Sig.) | .000 |

**වගු අංක 3.** පුද්ගල අයිතිවාසිකම් සහ ආරක්ෂාව පිළිබඳ දත්තවල විශ්වසනීයත්වය තහවුරු කිරීමේ පර්යේෂණය

| **දත්තවල විශ්වසනීයත්වය තහවුරු කිරීමේ පර්යේෂණය (Reliability Statistics)** | |
|---|---|
| කෝරෝන්බ්‍රාච් අල්ෆා අගය Cronbach's Alpha | අයිතම ගණන |
| .462 | 5 |




**රූපසටහන 2.** පුද්ගල අයිතිවාසිකම් සහ ආරක්ෂාව සම්බන්ධයෙන් දත්තදායකයන්ගේ දැනුවත්භාවය දර්ශකය ඇසුරෙන්

### 3.3 අපරාධ ගොදුරුකරණය හා සම්බන්ධ දැනුවත්භාවය

වර්තමානය වන විට පුද්ගල වින්දිතභාවය යන්න ඉතා සුලභ මාතෘකාවක් බවට පත් ව ඇත. ඒ අනුව නිරතුරු ව ම විවිධ අපරාධයන් හේතු කරගනිමින් වින්දිතභාවයට ලක්වීමේ අවධානම තුළ ජීවත් වන පොදු ජනයා එකී කාරණය සම්බන්ධයෙන් කොතරම් දුරට සවිඥානික ව සිටී ද යන්න අධ්‍යයනයට ලක් කිරීම වඩාත් සාර්ථක අපරාධ නිවාරණයකට මඟ පාදනු ඇත. ඒ අනුව ක්ෂේත්‍ර සමීකරණයට සහභාගී වූ දත්තදායකයන් අතුරින් 20.7 %ක ප්‍රතිශතයක් වින්දිතයන් වූ අතර 79.3 %ක ප්‍රතිශතයක් එසේ වින්දිතයන් නො වේ.

මෙලෙස සවිඥානිකත්වය පරික්ෂා කිරීමේ පළමු පියවර ලෙස ළමයින්ට එරෙහි ව සිදු වන වැරදි සම්බන්ධයෙන් පැමිණිලි කළ හැකි ආයතන මොනවා ද යන්න සම්බන්ධ අවබෝධය කෙසේ ද යන්න ආවේක්ෂණය විය.

මින් ළමා අපයෝජනයක් සිදුවීමක දී තමාට ඒ සම්බන්ධයෙන් පැමිණිලි කළ හැකි ආයතන නිවැරදි ව හඳුනාගත්තේ කුටුම්බ 35ක් පමණි. එය සමස්ත නියැදියෙන් 42.7 %කි. නියැදියෙන් 67.3%ක ප්‍රතිශතයකට මේ සම්බන්ධයෙන් නිවැරදි සහ විධිමත් අවබෝධයක් නො වී ය.


මෙලෙස වින්දිතභාවයට ලක් වූ පිරිසගේ නෛතික සාක්ෂරතාවෙහි ප්‍රමාණය සලකා බැලීම අංශ කිහිපයක් ඔස්සේ සිදු විය. එනම්, අයිතිවාසිකම් කඩ වීමක දී පැමිණිලි කළ හැකි ආයතනික විධි විධානයන් පිළිබඳ දැනුවත්භාවය කෙසේ ද?, ස්ත්‍රී දූෂණයක් සිදු විය හැකි අවස්ථා පිළිබඳ ව ඇති දැනුවත්භාවය කෙසේ ද?, ළමා අපයෝජන ආකරයන් පිළිබඳ ව ඇති දැනුවත්භාවය කෙසේ ද?, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අපරාධයක් බවට පවතින දැනුවත්භාවය කෙසේ ද?, සොරකම අපරාධයක් බවට පවතින දැනුවත්භාවය කෙසේ ද? මෙකී අංශයන් ඔස්සේ දත්තදායකයන්ගේ දැනුවත්භාවයේ තරම ආවේක්ෂණය විය. එහි සමස්ත ප්‍රතිඵලය වූයේ වින්දිතයන්ගේ නෛතික සාක්ෂරතාවෙහි මට්ටම දුර්වල බව යි.

වින්දිතයන් අතුරින් අපරාධ නීතිය සම්බන්ධයෙන් දැනුවත්භාවයෙන් යුක්ත වන්නේ 35%ක ප්‍රතිශතයකි. 65%ක වින්දිත කුටුම්බ සංඛ්‍යාවක් නෛතික සවිඥානිකත්වය අතින් ඉතා දුර්වල මට්ටමක සිටී. එමෙන් ම වින්දභාවයට ලක් නො වූ කුටම්බයන්ගේ නෛතික සවිඥානිකත්වය ද යම් තරමක දුර්වලතාවකින් යුක්ත වේ. නමුත් වින්දිතයන් හා සැසඳීමේ දී වින්දිතයන්ට වඩා 12%ක දැනුවත්භාවයේ ඉහළ මට්ටමක් වින්දිත නො වූ කුටුම්බයන්ට පවතී. එමෙන් ම වින්දිතයන් නො වූ

කුටුම්බයන්හි නො දැනුවත්භාවයට වඩා 12%ක ප්‍රතිශතයකින් වින්දිතයන්ගේ නො දැනුවත්භාවය ඉහළ ගොස් ඇත. සමස්තයක් ලෙස මෙරට ජීවත් වන පොදු ජනයා නෛතික සාක්ෂරතාවෙන් දුර්වල මට්ටමක සිටින බවට සනාථ වේ. එකී තත්ත්වය ගොදුරුකරණයේ දී තවදුරටත් තහවුරු වෙමින් අපරාධ පිළිබඳ නෛතික සවිඥානිකත්වයේ දුර්වලත්වය අපරාධ ගොදුරුකරණයෙහි ලා සෘජු බලපෑමක් සිදු කරනු ලබන බවට සනාථ වේ.

**වගු අංක 4.** වින්දිත තත්ත්වයට සාපේක්ෂ ව අපරාධ පිළිබඳ නෛතික සාක්ෂරතාවේ ප්‍රමාණය සමස්තයක් ලෙස

| **වින්දිතභාවයේ තත්ත්වය** | **සමස්ත දැනුවත්භාවයේ ප්‍රතිශතය** | | |
|---|---|---|---|
| වින්දිතයන් | දැනුවත් | නො දැනුවත් | එකතුව |
| | 35% | 65% | 100% |
| වින්දිතයන් නො වූ | 48% | 52% | 100% |




**රූපසටහන 3.** වින්දිතභාවයක දී නීතිය පිළිබඳ දැනුමේ අවශ්‍යතාව

එමෙන් ම රූපසටහන 3 හි සඳහන් පරිදි වින්දිතභාවයට ලක් වූ අයෙක් එය අපරාධයක් බවට නිවැරදි ව හඳුනා ගනිමින්, කිසිදු බලපෑමකින් තොර ව නීතියේ පිහිට පැතීම සඳහා නීතිය පිළිබඳ ව සාක්ෂරතාවක් තිබීම කෙතරම් දුරට යහපත් ද යන්න විමසීමේ දී 78%ක දත්තදායකයන් දක්වන පරිදි වින්දිතභාවයක දී නීතිය පිළිබඳ ව දැනුමක් තිබීම ඉතා යහපත් ය. 12.2%ක් තරමක් යහපත් බවත් 9.8 %ක් යහපත් බවත් දක්වයි. ඒ අනුව දත්තදායකයන් සමස්තය ම වින්දිතභාවයක දී නීතිය පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය බව දක්වයි.

### 3.4 අපරාධ යුක්තික්‍රමය හා එහි ක්‍රියා පටිපාටිය පිළිබඳ දැනුවත්භාවය

ශ්‍රී ලාංකේය සමාජ ක්‍රමය තුළ අපරාධ යුක්ති ක්‍රමය හා එහි ක්‍රියා පටිපාටියෙහි ස්වරූපය පිළිබඳ ව විමසීමේ දී ශ්‍රී ලාංකික අපරාධ යුක්ති ක්‍රමයේ ප්‍රගතිශීලි තත්ත්වයන් පිළිබඳ ව බෙහෙවින් සතුටුදායක ය. එමෙන් ම එහි ප්‍රතිවිරුද්ධ තත්ත්වයන් පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී යම් යම් ඛේදනීය තත්ත්වයන් තුළ ගමන් කරන්නේ ද යන ගැටලුව පැන නඟී. අපරාධ යුක්ති ක්‍රමයන් සහ අදාළ බලධාරීන් සමග කටයුතු කිරීමේ දී නීතිය නො දැන සිටීමෙන් ගැටලුකාරී තත්ත්වයන් උදාවී තිබේ ද යන්න අධ්‍යයනය කිරීම මෙම විචල්‍යයෙහි ප්‍රධාන අරමුණ යි. එමෙන් ම ජනතාව නීතිය නො දැන සිටීමෙන් අපරාධ යුක්ති ක්‍රමය තමන්ට රිසි අයුරින් නීතිය නිර්වචනය කරමින් පොදු ජනයා පීඩාවට පත් කරන්නේ ද සහ නීතිය පිළිබඳ ව පොදු ජනයා සවිඥානික ව සිටීමෙන් ඔවුන් නෛතික ව බලගැන්වීමේ හැකියාව අධ්‍යයනය කිරීම කරයි. එමඟින් අපරාධ පාලනය හා නිවාරණය කිරීමේශක්‍යතාවක් පවතින්නේ ද යන්නත් මෙහි දී අධ්‍යයනය වේ. සමීක්ෂණ සඳහා සහභාගි වූ කුටුම්බයන් අතුරින් කුමන හෝ අපරාධ වරදක් සඳහා වරදකරුවන් වී ඇති කුටුම්බ ගණන සමස්ත නියැදියෙන් 11%කි. එලෙස වරදකරුවන් බවට ලක් නො වූ කුටුම්භයන් 89%කි. මෙසේ වරදකරුවන් බවට පත් වූ මෙන් ම එසේ නො වූ කුටුම්බයන් ද

රටෙහි අපරාධ යුක්ති ක්‍රියා පටිපාටිය එනම්, පොලිසිය, අධිකරණය, බන්ධනාගාර සහ වෙනත් විශෝධන ආයතන සමඟ සම්බන්ධ වී ක්‍රියා කිරීමේ දී එහි නිලධාරීන් කුමන හෝ අවස්ථාවක තමන් පීඩාවට පත්කර තිබේ ද යන්න පිළිබඳ විමසුමේ ප්‍රතිඵලය වූයේ, වරදකරුවන් බවට පත් ව සිටින සියලු කුටුම්බයන් මෙසේ පීඩාවට පත් ව සිටින අතර ම වරදකරුවන් නො වෙන්නන්ගෙන් ද 56.2%ක ප්‍රතිශතයක් කුමන හෝ අවස්ථාවක දී අපරාධ යුක්ති ක්‍රියා පටිපාටිය මඟින් පීඩාවට පත් ව තිබේ. සමස්තයක් ලෙස 61%ක ප්‍රතිශතයක් මෙසේ පීඩිත ය.

එමෙන් ම අපරාධ යුක්ති ක්‍රමයේ දී නෛතික අනවබෝධය අපහසුතාවන්ට හේතු නො වූ බවට 14.7% ප්‍රතිශතයක් දක්වන අතර නෛතික අනවබෝධය අපහසුතාවන්ට හේතු වූ බවට 85.3%ක ප්‍රතිශතයක් දක්වනු ලබයි. එසේ නම් අනෙක් අතට පොලිසිය හෝ වෙනත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමඟ කටයුතු කිරීමේ දී නෛතික සවිඥානිකත්වය යහපත් මට්ටමක පවතී නම් එහි දී සිදු වන අපහසුතාවන් මඟ හරවා ගැනීමේ ශක්‍යතාව කෙසේ වේ ද යන්න ද විමසන ලදි.

**වගු අංක 5.** අපරාධකාරීත්වයේ තත්ත්වය සහ අපරාධ යුක්තියේ පීඩිතභාවය (Crosstabulation විශ්ලේෂණය)

| **අපරාධකාරීත්වයේ තත්ත්වය සහ අපරාධ යුක්තිය හමුවේ පීඩිතභාවය** | | | **යුක්තියේ පීඩාකාරී බව (Justice Distress Status)** | | **එකතුව** |
|---|---|---|---|---|---|
| | | | ඔව් | නැත | |
| **අපරාධමය තත්ත්වය (Criminal Status)** | ඔව් | අගය | 9 | 0 | 9 |
| | | ප්‍රතිශතය | 100% | 0.0% | 100% |
| | නැත | අගය | 41 | 32 | 73 |
| | | ප්‍රතිශතය | 56.2% | 43.8% | 100% |
| **එකතුව** | | **අගය** | **50** | **32** | **82** |
| | | **ප්‍රතිශතය** | **61%** | **39%** | **100%** |

**වගු අංක 6.** නෛතික සවිඥානිකත්වයට සාපේක්ෂව අපහසුතාවන් මඟ හරවා ගැනීමේ හැකියාව

| **අපහසුතා මඟ හරවා ගැනීමේ හැකියාව (Avoidance Difficulties)** | **අගය** | **ප්‍රතිශතය** | **වලංගු ප්‍රතිශතය** | **සමුච්චිත පූර්වාදර්ශය** |
|---|---|---|---|---|
| හොඳින් ම මඟ හරවාගත හැකි ය (Well Avoidable) | 54 | 65.9% | 65.9% | 65.9% |
| තරමක් මඟ හරවාගත හැකි ය (Slightly Avoidable) | 15 | 18.3% | 18.3% | 84.1% |
| මඟ හරවාගත හැකි ය (Avoidable) | 13 | 15.9% | 15.9% | 100% |
| **එකතුව** | **82** | **100%** | **100%** | |

ඒ අනුව නෛතික සවිඥානිකත්වය තුළින් අපහසුතාවන් හොඳින් ම මඟහරවා ගැනීමේ හැකියාව පවතින බවට සමස්ත නියැදියෙන් 65.9%ක ප්‍රතිශතයක් දක්වයි. එමෙන් ම අපහසුතාවන් මඟ හරවාගත හැකි බවට දක්වන කුටුම්බ ප්‍රතිශතය 15.9%කි. තරමක් මඟ හරවාගත හැකි බවට විශ්වාස කරන්නන් 18.9%කි. කිසිවෙකුත් මඟහරවාගත නො හැකි බවට නො දක්වයි.

පූර්ණ නියැදිය දක්වන ආකාරයට අපරාධ යුක්ති ක්‍රමය සමඟ කටයුතු කිරීමේ දී නෛතික සවිඥානිකත්වයේ අවශ්‍යතාව සමාජය තුළ දැඩි ව පවතින බවට තහවුරු වෙයි.

### 3.5 දඬුවම් හා සම්බන්ධ දැනුවත්භාවය

අපරාධ නීතිය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී හරයාත්මක නීතිය වන දණ්ඩනීති සංග්‍රහය මඟින් අපරාධ නීතියේ න්‍යායාත්මක අංශය පිළිබිඹු කරයි. ඒ අනුව අපරාධ නීතියේ විවිධ අපරාධමය වැරදි නිර්වචනය කිරීම, ඒවායේ මූලිකාංග දැක්වීම, සංකල්ප අයිතිවාසිකම් පිළිබඳ ව විග්‍රහ කිරීම මෙන් ම ඒ ඒ අපරාධයන්ට හිමි දඬුවම් විග්‍රහ කිරීම යනාදිය හරයාත්මක නීතිය වන 1833 අංක 02 දරන දණ්ඩනීති සංග්‍රහය මඟින් දක්වයි. අපරාධ නීතියේ ප්‍රධාන කොටසක් වන දණ්ඩනය පිළිබඳ ව පුද්ගල දැනුවත්භාවයේ මට්ටම අංශ කිහිපයක් ඔස්සේ සමීක්ෂණ සඳහා යොදා ගැනිණ.

ඒ අනුව අපරාධ නීතියේ ප්‍රධාන අංගයක් වන දණ්ඩනය පිළිබඳ ව පොදුජන සවිඥානිකත්වයේ තරම ද අධ්‍යයනය විය. අපරාධ නීතියෙහි දක්වා ඇති දඬුවම් සම්බන්ධයෙන් දත්තදායකයින් දැනුවත් ව සිටී ද යන්න පිළිබඳ ව පරීක්ෂණාත්මක ප්‍රශ්න කිහිපයක් මඟින් පරීක්ෂා කරන ලදි. එහි දී ලබාගත් ප්‍රතිඵලයන් අනුව දඬුවම් පිළිබඳ ව දැනුවත්භාවයෙන් යුක්ත වන්නේ දත්තදායකයින් අතුරෙන් 40%ක ප්‍රතිශතයක් පමණි. එමෙන් ම 60%ක ප්‍රතිශතයක් දඬුවම් සම්බන්ධයෙන් කිසිදු දැනුවත්භාවයකින් යුක්ත නො වේ. දඬුවම් පිළිබඳ නො දැනුවත්භාවය පුද්ගලයා පහසුවෙන් අපරාධ සිදු කිරීමෙහි ලා යොමු කරවයි ද යන්න සම්බන්ධයෙන් දත්තදායකයින්ගේ අත්දැකීම් අනුව විමසන ලදි. එහි දී 45%ක ප්‍රතිශතයක් අනිවාර්යයෙන් ම දණ්ඩනය පිළිබඳ අනවබෝධය අපරාධ කෙරෙහි හේතු කරවන බවට දක්වයි. 21%ක් හේතු වන බවටත්, 24%ක ප්‍රතිශතයක් තරමක් හේතු වන බවට දක්වයි. එමෙන් ම දණ්ඩනය පිළිබඳ අනවබෝධය අපරාධ සිදු කිරීමට හේතු නො වන බවට 6%ක ප්‍රතිශතයක් ද කිසිසේත් ම හේතු නො වන බවට 4%ක ප්‍රතිශතයක් ද දක්වයි. ඒ අනුව දණ්ඩනය පිළිබඳ අවබෝධය අපරාධ සිදු වීමට එරෙහි ප්‍රබල බලපෑමකින් යුක්ත බවට 90%ක ප්‍රතිශතයකින් තහවුරු කරයි. මෙසේ නො දැනුවත්භාවය හමුවේ අපරාධ සහ එකී අපරාධයන් විෂයෙහි හිමි දණ්ඩනයන් පිළිබඳ ව අවබෝධයේ දැඩි අවශ්‍යතාවක් පොදු සමාජය තුළ පවතින බවට කියා සිටින්නන්ගේ සමස්ත ප්‍රතිශතය 93%කි.

එමෙන් ම දඬුවම්වලට අමතර ව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක අපරාධ නීතිය පිළිබඳ ව අවබෝධයේ අවශ්‍යතාවක් දැඩි ව පවතින බවට අවධාරණය කර තිබීම අධ්‍යයනයේ සුවිශේෂීත්වයකි. එනම්, 65%ක ප්‍රතිශතයක් දක්වනුයේ නීතිය පිළිබඳ අවබෝධයේ අවශ්‍යතාවය තදින් ම පවතින බවකි. 21%ක් නීතිය පිළිබඳ අවබෝධයේ අවශ්‍යතාව පවතින බවට දක්වන අතර ම 15%ක ප්‍රතිශතයක් තරමක අවශ්‍යතාවක් පවතින බවට දක්වයි. සමස්ත නියැදිය ම නීතිය පිළිබඳ අවබෝධය අත්‍යවශ්‍ය බව දක්වයි. මේ අනුව නීතිය පිළිබඳ අවබෝධය ලබා ගැනීමේ ඉතා ඉහළ මට්ටමේ අවශ්‍යතාවක් ශ්‍රී ලාංක්ය පුරවැසියන්ට පවතින බවට පැහැදිලි වේ.

### 3.6 නෛතික සාක්ෂරතාව හා අපරාධ පාලනය හා නිවාරණයේ ශක්‍යතාවය


ඉහත විශ්ලේෂණයන්ට අනුව පෙනී යනුයේ පොදු සමාජයේ නෛතික සාක්ෂරතාව ඉතා දුර්වල මට්ටමක පවතින බව ය. ඒ හා සමගාමී ව අපරාධයන්ගේ ව්‍යාප්තිය ද ශීඝ්‍රය. ඒ අනුව මෙකී අපරාධයන්ගේ පාලනය වීමක් දක්නට නො ලැබෙන අතර අධ්‍යයනයේ පරමාර්ථයන්ට අනුකූල ව සමාජය නෛතික වශයෙන් බලගැන්වීම මඟින් මෙන් ම නෛතික සවිඥානිකත්වයේ ප්‍රමාණය ඉහළ යන්නේ නම් අපේක්ෂිත අපරාධයන්ගේ පාලනය හා නිවාරණය වීමක් ලබාගත හැකි ද? යන්න අධ්‍යයනය වේ.

අධ්‍යයනයේ දත්තදායකයන්ගෙන් මිනිසුන් නීතියට ගරු නො කිරීමට බලපානු ලබන හේතූන් කිහිපයක් දක්වන ලදි. ඒ අනුව ස්වයං විනයක් නොමැති වීම, නීතිය නො දැනීම, නීතියට හුරු නො වීම, නීතියට ගරු කිරීමේ සමාජයක් නොමැති වීම, නීතිය පිළිබඳ ව ඇති සෘණාත්මක ආකල්පයන්, නීතිය දේශපාලනීකරණය වීම, අපරාධ යුක්ති ක්‍රමයේ අඩු-පාඩු යනාදි හේතු සාධකයන් මත පිහිටා මිනිසුන් නීතියට අනුව ජීවත් නො වීමේ ප්‍රතිඵලයක් ලෙස සමාජ අසාධාරණය රජයන සමාජයක් ඇති විය හැකි ය. මෙලෙස නීතිගරුක සමාජයක් නොමැති වීම මඟින් අපරාධයන්ගේ වර්ධනය ද දිගින් දිගට ම සිදු වේ.

එමෙන් ම කිසියම් අපරාධමය සිදු වීමක දී දැඩි ව නීතිය ක්‍රියාත්මක වන බවට පවතින විශ්වාසය මත එකී අපරාධය සිදු කිරීමට පෙළඹීමේ ස්වභාවය කෙසේ වේ ද යන්න පිළිබඳ ව විමසීමේ දී දත්තදායකයින් 99%ක ප්‍රතිශතයක් ඒ බව තහවුරු කරමින් වඩාත් යහපත් අවබෝධයක් පවතී නම් අපරාධකාරීත්වයෙහි නියුතු නො වන බවට දක්වයි. එමෙන් ම තරමක් යොමු විය හැකි බවට 1%ක් පමණක් දක්වයි. එකී යොමු වීමෙහි ලා හදිසි කෝපය, ප්‍රතිලාභය අධික වීම, මානසික ආබාධයන් වැනි වෙනත් සාධකයන්ගේ බලපෑම තිබිය හැකි ය.

විශේෂයෙන් ම නෛතික සාක්ෂරතාවට සාපේක්ෂ ව අපරාධ පාලනය හා නිවාරණයේ සම්භාවිතාව සැලකීමේ දී නෛතික සාක්ෂරතාව මඟින් අපරාධ පාලනය හා නිවාරණය කිරීමේ තරමක ශක්‍යතාවක් පවතින බවට 32%ක ප්‍රතිශතයක් දක්වයි. එමෙන් ම මෙම ක්‍රමවේදය හරහා අපරාධ පාලනය හා නිවාරණය කිරීමේ ශක්‍යතාව පවතින බවට 13%ක ප්‍රතිශතයක් දක්වන ලද අතර ම නෛතික සාක්ෂරතාව මඟින් අපරාධ පාලනය හා නිවාරණය කිරීමේ ශක්‍යතාව හොඳින් ම පවතින බවට සමස්ත නියැදියෙන් කුටුම්බ 55%ක් දක්වයි.

ඒ අනුව සමස්ත නියැදිය ම නෛතික සාක්ෂරතාව තුළින් අපරාධ පාලනය හා නිවාරණය කළ හැකි බව ඒකමතික ව පිළිගන්නා අතර ම අධ්‍යයනය ඒ බව මනාව තහවුරු කරයි.




**රූපසටහන 4.** නෛතික සාක්ෂරතාවයට සාපේක්ෂව අපරාධ පාලනය හා නිවාරණයේ සම්භාවිතාව

ඒ අනුව රාජ්‍යයක නීතිවිරෝධී චර්යාවන්ගේ වැඩි වීම ආර්ථිකමය, සමාජීය මෙන් ම දේශපාලනික වශයෙනුත් දුර්වලතාවට පත් වීමට මූල හේතු විය හැකි ය. අපරාධකරුවන් නඩත්තුවට මෙන් ම අපරාධ යුක්ති ක්‍රියාපටිපාටියේ පූර්ණ නඩත්තුව සඳහා වාර්ෂික ව දැරිය යුතු පිරිවැය ඉතා අධික ය. එවැනි රාජ්‍යයන් සමාජීය මෙන් ම ආර්ථික වශයෙන් ද පිරිහීමට ලක් වේ. ඒ අනුව අපරාධ පාලනය හා නිවාරණ සඳහා අවධානය යොමු කිරීම රටක දළ දේශීය නිෂ්පාදන වැඩි කිරීම, ආයෝජන, දේශපාලනික ක්‍රියාකාරීභාවය යනාදිය තරම් ම වැදගත් ය. ඒ බව සනාථ කරමින් අධ්‍යයනය සඳහා සහභාගි වූ දත්තදායකයන් අපරාධ පාලනය හා නිවාරණය උදෙසා මිනිසුන්ට නීතිය පිළිබඳ දැනුම ලබා දීමට කටයුතු කිරීම රාජ්‍යයේ ප්‍රධාන වගකීම බවට දක්වයි. එහි දී 90%ක ප්‍රතිශතයක් රාජ්‍යය මේ වෙනුවෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව දක්වන අතර අවශ්‍ය බවට 9%ක් සහ තරමක් අවශ්‍ය බවට 1%ක ප්‍රතිශතයක් දක්වයි.

**වගු අංක 7.** ඉහත එක් එක් මානයන්ගේ සමස්ත සාරාංශය

| **විශ්ලේෂණාත්මක කරුණ** | **ධනාත්මක ප්‍රතිචාරවල ප්‍රතිශතය** | **සෘණාත්මක ප්‍රතිචාරවල ප්‍රතිශතය** |
|---|---|---|
| වින්දිතයන්ගේ නෛතික සාක්ෂරතාව | 35% | 65% |
| අපරාධ හා ආයතනික ක්‍රියා පටිපාටීන් පිළිබඳ දැනුවත්භාවයේ මට්ටම | 41% | 59% |
| දඬුවම් පිළිබඳ සමස්ත දැනුවත්භාවය | 40% | 60% |
| වින්දිතභාවයක දී නීතිය පිළිබඳ දැනුමේ අවශ්‍යතාව | 100% | 0% |
| අපරාධ යුක්තියේ දී නෛතික අවබෝධය අපහසුතාවන්ට හේතු වීම | 15% | 85% |
| නෛතික අවබෝධයට සාපේක්ෂ ව අපහසුතාවන් මඟ හරවා ගැනීමේ හැකියාව | 100% | 0% |
| දඬුවම් පිළිබඳ අනවබෝධය සහ අපරාධවලට යොමු වීමේ ප්‍රමාණය | 10% | 90% |
| දණ්ඩනය පිළිබඳ අවබෝධයේ අවශ්‍යතාව | 94% | 6% |
| නීතිය පිළිබඳ අවබෝධයේ අවශ්‍යතාව | 100% | 0% |

ඉහත දත්ත විශ්ලේෂණයන් තුළින් දත්තදායකයින් නීතිමය කරුණු කාරණා පිළිබඳ ව දක්වනු ලබන දැනුම් මට්ටම පරීක්ෂා කිරීමත්, එකී දැනුවත්භාවය අපරාධ පාලනය හා නිවාරණය කෙරෙහි කෙතරම් දුරට බලපෑම් සහිත ද යන්නත් දක්වයි. ඒ අනුව නෛතික සාක්ෂරතාව පිළිබඳ දැනුම මනිනු ලැබූ

විචල්‍යයන්ගේ සාරංශ දත්ත විශ්ලේෂණය ඉහත වගු අංක 3.6. තුළින් දැක්වේ. එකී කරුණු කාරණාවලට අමතර ව සහභාගි වූ දත්තදායකයින්ගේ සමාජ තත්ත්වය හා නෛතික සාක්ෂරතාව අතර සහසම්බන්ධය ද අධ්‍යයනය විය.

### 3.6.1 පුද්ගල නෛතික සාක්ෂරතාවය පුද්ගල ආර්ථිකය හා අධ්‍යාපනය අතර ඇති සම්බන්ධතාවය


මෙහි දී පුද්ගල සමාජ තත්ත්වය මැනීම ප්‍රධාන අංශ දෙකක් ඔස්සේ සිදු වේ. එනම්, ආර්ථික මට්ටම සහ අධ්‍යාපනික මට්ටම ලෙස ය. අධ්‍යාපනික සහ ආර්ථික මට්ටම් අනුව විභේදනය වූ සමාජ තත්ත්වයන් තුළ නෛතික සාක්ෂරතාවේ මට්ටම පුද්ගල සමාජ තත්ත්වයන් අනුව වෙනසකට ලක් වන්නේ ද යන්න අධ්‍යයනය විය. ඒ අනුව තෝරාගත් අපරාධ වර්ගයන් කිහිපයක් සම්බන්ධයෙන් පවතින දැනුම පරීක්ෂාවට ලක් විය.

ආර්ථික මට්ටම් වර්ගීකරණයක් ඇසුරෙන් යෝජිත දැනුවත්භාවය වෙනස් වන්නේ ද යන්න සම්බන්ධයෙන් විමසුමේ සමස්ත ප්‍රතිඵලය වූයේ ආර්ථික මට්ටම අනුව අපරාධ සම්බන්ධ පුද්ගල දැනුවත්භාවය බලපෑම් රහිත බව යි. එමෙන් ම එකී තත්ත්වය ම අධ්‍යාපනික මට්ටම් අනුවද සනාථ විය. අධ්‍යාපනය අනුව යම් දැනුවත්භාවයක් පවතින බවට තහවුරු වුව ද අධ්‍යාපනික මට්ටම් අනුව ම පුද්ගල නො දැනුවත්භාවයේ ප්‍රබල වෙනස් වීමක් දක්නට නො ලැබෙන බව පැහැදිලි වේ.

ඒ අනුව ආර්ථිකය හෝ අධ්‍යාපනික මට්ටම් අනුව නියැදියේ නො දැනුවත්භාවය තරමක අඩු වැඩි වීමක් පෙන්නුම් කළ ද ප්‍රබල වෙනසක් දක්නට නො ලැබෙන නියාවෙන් පොදුවේ ශ්‍රී ලාංකිකයන් අපරාධ නීතිය පිළිබඳ නො දැනුවත්භාවයකින් යුක්ත බවට කිව හැකි ය. ඒ අනුව මෙය පොදු අවශ්‍යතාවක් බව වගු අංක 8 හි දැක්වේ.

**වගු අංක 8.** ආර්ථික මට්ටම් අනුව අපරාධ හා සම්බන්ධ දැනුවත්භාවය

| ආර්ථික මට්ටම | දැනුවත් | නො දැනුවත් |
|---|---|---|
| පහළ ආර්ථික මට්ටම් | 31% | 69% |
| මධ්‍යම ආර්ථික මට්ටම් | 40% | 60% |
| ඉහළ ආර්ථික මට්ටම් | 37% | 63% |




| | හොඳින් දැනුවත් | තරමක් දැනුවත් | දැනුවත් | නොදැනුවත් | කිසිසේත් නොදැනුවත් |
|---|---|---|---|---|---|
| සා පෙළ | 2 | 5 | 3 | 23 | 2 |
| උ පෙළ | 4 | 7 | 2 | 8 | 3 |
| ඩිප්ලෝමා | 0 | 1 | 0 | 6 | 0 |
| වෘත්තීය පුහුණු | 1 | 1 | 1 | 3 | 1 |
| උපාධි | 1 | 1 | 0 | 4 | 2 |
| පශ්චාත් උපාධි හෝ ඉහළ | 1 | 0 | 0 | 0 | 0 |

සා පෙළ  උ පෙළ  ඩිප්ලෝමා  වෘත්තීය පුහුණු  උපාධි  පශ්චාත් උපාධි හෝ ඉහළ

**රූපසටහන 5.** අධ්‍යාපන මට්ටම අනුව අධ්‍යයනයට පාදක වූ අපරාධයන්ගේ දැනුවත්භාවය පිළිබඳ එකතුව

අධ්‍යයනයේ දී එකිනෙක අපරාධ සම්බන්ධයෙන් දත්තදායකයින්ගේ දැනුවත්භාවය ගත් කල රූපසටහන 5 සඳහන් පරිදි අධ්‍යාපනික මට්ටම් අනුව වුව ද පොදුවේ බහුතරය නො දැනුවත් මට්ටම

නියෝජනය කරන අතර එහි දී නො දැනුවත් මට්ටමේ සිටින බහුතරයක් සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබූවන් ය. එහි ප්‍රතිශතය 65.7% කි. එමෙන් ම ක්‍රමයෙන් උසස් පෙළ ඩිප්ලෝමා, උපාධි දක්වා නො දැනුවත්භාවයේ ප්‍රතිශතයේ අවම වීමක් දක්නට ලැබේ. උපාධිය දක්වා අධ්‍යාපනයේ නියුතු වූවන්ගේ නො දැනුවත්භාවයේ ප්‍රතිශතය 50% කි. ඒ අනුව අධ්‍යාපන මට්ටම හා ආර්ථිකය වැඩි වන විට නෛතික සාක්ෂරතාව වැඩි නො වන අතර ම අධ්‍යාපන මට්ටම හා ආර්ථිකය අඩු වන විට නෛතික සාක්ෂරතාව ද අඩු නො වේ. ඒ අනුව මෙම විචල්‍යයන් අතර ධනාත්මක සහසම්බන්ධතාවක් නොමැති බව පැහැදිලි වේ.

## 4. නිගමන සහ නිර්දේශ

අපරාධ නීතිය පිළිබඳ ව සාමාන්‍ය ජනතාවගේ අවබෝධය හා ඒ හා සම්බන්ධ ක්‍රියාදාමයන් පිළිබඳ පර්යේෂණාත්මකව තහවුරු කිරීමක් වශයෙන් රුසියානු මහාචාර්යවරයකු වන Elena Pevtsova, 2013 වර්ෂයේ දී ළමයින් හා තරුණයන්ගේ නීතිමය දැනුවත්භාවය පාසල් කේන්ද්‍ර කරගනිමින් අධ්‍යයනය කර ඇත. මෙකී අධ්‍යයන අරමුණ වූයේ, නෛතික දැනුවත්භාවය අධ්‍යයනය කිරීම තුළින් නෛතික සංස්කෘතියේ මට්ටම ඉහළ නැංවීම යි. එහි දී ඔහුගේ නිගමනය නම් ශිෂ්‍යයන්ගේ නෛතික දැනුවත්භාවය ඔවුන්ගේ අනාගතය නිර්මාණය වීම කෙරෙහි බලපානු ලබන බව යි. සමාජය තුළ දරුවා සට්ටනය වීමේ දී මෙකී දැනුවත්භාවය යන්න අත්‍යවශ්‍ය බව යි (Elena Pevtsova, 2013). Elena Pevtsovaගේ පර්යේෂණයේ දිගුවක් වූ මෙම අධ්‍යයනය තරුණ ප්‍රජාවන්ගේ නෛතික සාක්ෂරතාවෙහි ප්‍රමාණාත්මකභාවය ඔවුන්ගේ අනාගතය නිර්මාණය වීම කෙරෙහි බලපානු ලබන බවත්, සමාජ සට්ටනය උදෙසා මෙකී දැනුවත්භාවය අත්‍යවශ්‍යය බවත් තවදුරටත් පෙන්නුම් කරනු ලබන්නක් විය.

එමෙන් ම සෞදි අරාබි මහාචාර්යවරයකු වන Farihan Farouk Helmy, 2017 ඇතුළු පර්යේෂණ කණ්ඩායම සෞදි අරාබියේ තායිෆ් කලාපය තුළ ළමා අපචාර හා ඒවා නො සලකා හැරීමත්, එය නීති විරෝධී ක්‍රියාවක් බවටත් මව්වරුන් අතර පවතින දැනුම මැන බලන ලදි. එහි දී මව්වරුන් හතළිස් දෙනෙකු යොදා ගනිමින් සිදු කළ මෙම පර්යේෂණය මගින් දරුවන් ශාරීරික ව හිංසනයට පත් කිරීම අපරාධයක් බවට තමාට වැටහීමක් නොමැති බවත්, එය සාමාන්‍ය ක්‍රියාවක් බවටත් බොහෝ අය දක්වන ලදි. මෙහි අවසන් නිගමනය වූයේ, ළමා අපයෝජන හා ඒවා නො සලකා හැරීමේ ගැටලුව පාලනය සඳහා වන පළමු පියවර ලෙස ප්‍රජාව අතර දැනුවත්භාවය ව්‍යාප්ත කළ යුතු බව යි (Helmy, 2017). ඒ අනුව එකී කාරණා තවදුරටත් තහවුරු කරමින් එකී පර්යේෂණයේ ම ඉදිරි පියවරක් ලෙස මෙය දැක්වීමේ හැකියාවෙන් යුක්ත ය.

එමෙන් ම 2013 වර්ෂයේ Miranda Bevan පාසල් සිසුන් 65 දෙනෙකු යොදා ගනිමින්, යෞවන යෞවනියන් පවතින අපරාධ යුක්ති ක්‍රියාපටිපාටිය සම්බන්ධ නො දැනුවත්කමින් පසුවීම පොලිසිය වැනි ආයතනවලත්, ඔවුන්ගේ අයිතිවාසිකම් හිමිවීම සම්බන්ධයෙනුත් අසාධාරණකම්වලට ලක් වීමේ අවදානමක් පවතී ද යන්න අධ්‍යයන කරන ලදි. මෙම පර්යේෂණය මගින් මූලික වශයෙන් තහවුරු වූයේ, රටේ නීතිමය තත්ත්වයන් පිළිබඳව තරුණ පිරිස් අතර පවතින දැනුම අවම බවත්, එකී නො දැනුවත්කම බොහෝ දුරට මත්ද්‍රව්‍ය භාවිතයන් සඳහා ගොදුරු වීම, අපරාධ සිදු කිරීමෙහි ලා පෙළඹීම, එමෙන් ම ඔවුන් අපරාධ යුක්තිය ආයතනවල අසාධාරණකම්වලට ලක් වීම යනාදිය කෙරෙහි බලපෑ ඇති බවත් ය (Bevan, 2013). Miranda Bevan ගේ පර්යේෂණයේ දිගුවක් නොහොත් ප්‍රගතියක් ලෙසට දැක්විය හැකි මෙකී අධ්‍යයනය Bevan දක්වන ආකාරයට ම සමාජය අපරාධ යුක්ති ක්‍රියා පටිපාටිය සම්බන්ධ නො දැනුවත්කමින් පසුවීම පොලිසිය හා අපරාධ යුක්තිය සම්බන්ධයෙන් අනෙකුත් ආයතනවල තම අයිතිවාසිකම් හිමි වීම සම්බන්ධයෙන් අසාධාරණකම්වලට ලක් වීමේ අවදානමක් පවතින බවත්, වින්දිතභාවයේ හිණිපෙත්තට යාමේ හැකියාව ඉතා හොඳින් පවතින බවත් සත්‍යතාවෙන් තහවුරු කරන්නක් විය.

අධ්‍යයනයේ කරුණු කාරණාවලට අනුව පුද්ගල නෛතික සාක්ෂරතාව දියුණු කිරීම තුළින් අපරාධ පාලනය හා නිවාරණය කර ගැනීමේ ශක්‍යතාවය හොඳින් ම පවතින බව සමීක්ෂණය මගින් තහවුරු වූ පැහැදිලි නිගමනය යි. එහි දී, නෛතික සාක්ෂරතාව මගින් අපරාධ පාලනය හා නිවාරණය කිරීමේ තරමක ශක්‍යතාවක් පවතින බවට 32%කුත්, සාමාන්‍ය ශක්‍යතාව පවතින බවට 13%කුත්, නෛතික සාක්ෂරතාව මගින් අපරාධ පාලනය හා නිවාරණය කිරීමේ ශක්‍යතාව හොඳින් ම පවතින බවට සමස්ත නියැදියෙන් කුටුම්බ 55%කුත් දැක්වීමෙන් ඒ බව ගම්‍ය වේ. එමෙන් ම ශ්‍රී ලාංකික සමාජයේ ක්‍රියාත්මක අපරාධ නීතිය පිළිබඳ ව ප්‍රජා දැනුවත්භාවය බෙහෙවින් දුර්වල මට්ටමක පවතින බවට පර්යේෂණය ඇසුරෙන් නිගමනය විය. එනම්, දත්තදායකයින් ලෙස සහභාගි වූ අපරාධ වින්දිතයන්ගෙන් 65%ක පිරිසක් නෛතික සාක්ෂරතාවයෙන් දුර්වල මට්ටමක සිටී. එකී තත්ත්වය ආර්ථිකය හෝ අධ්‍යාපනය අනුව වුව ද වෙනසක් දක්නට නො ලැබේ. ඒ බව රූපසටහන 5 මගින් මගින් දැක්වේ. එනම්, අපරාධ හා අපරාධ නීතිය සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාවට පවතිනුයේ හුදෙක් අහුලාගත්, අවිධිමත් දැනුමකි. එමෙන් ම අපරාධ නීතිය මගින් පුද්ගලයාට ලබාදී ඇති මූලික ආරක්ෂාවන්, ක්‍රමෝපායන් සහ අයිතිවාසිකම් සම්බන්ධයෙන්වත් දැනුවත්භාවයක් නොමැති අවිඥානික සමාජයක් පවතින බවට දත්තදායකයින්ගේ දැනුම ඇසුරින් සිදු කළ විමසීම්වල දී නිගමනය විය. ඒ බව රූපසටහන 2

විශ්ලේෂණයන් තුළින් තහවුරු විය. නීති සාක්ෂරතාවේ දුර්වලතාව අපරාධ යුක්ති ආයතනයන් තුළ සාමාන්‍ය ජනයා අපහසුතාවන් හා අසාධාරණකම්වලට ලක් වීම කෙරෙහි ද බලපෑම් සහිත ය. ඒ බව අපරාධ යුක්තික්‍රමය හා එහි ක්‍රියා පටිපාටිය පිළිබඳ දැනුවත්භාවය කෙරෙහි ඉහත සිදු කරනු ලැබූ දත්ත විශ්ලේෂණයන්ට අනුකූල ව පැහැදිලි වේ.

විශේෂයෙන් අධ්‍යයන නියැදියේ පවතින නෛතික ක්‍රමවේද පිළිබඳ නො දැනුවත්භාවය අපරාධ වින්දිතභාවයට පත් වීම කෙරෙහි ඍජු ව ම බලපා ඇත. එමෙන් ම අපරාධ නීතිය පිළිබඳ දැනුවත්භාවය සහ එහි දැඩි බව පිළිබඳ අවබෝධය හමුවේ පුද්ගලයන් අපරාධවලට යොමු වීමේ ප්‍රවණතාව බෙහෙවින් අවම බව ද තහවුරු විය. එනම්, අපරාධ නීතිය පිළිබඳ සවිඥානිකත්වය තුළින් පුද්ගල අපරාධකාරී චර්යාවන් අවම කර ගැනීමේ ශක්‍යතාවක් පැහැදිලි ව ම පවතී. දණ්ඩනය පිළිබඳ අනවබෝධයට සාපේක්ෂ ව අපරාධවලට පහසුවෙන් යොමු විමේ ප්‍රවණතාවක් ද පවතී. අවිඥානික සමාජයක් තුළ යම් තැනැත්තෙකු අපරාධයක් සිදු කිරීමේ දී අවිඥානික සමාජයේ අනෙකුත් සාමාජිකයන්ගේ අනවබෝධය ඔහු වාසියක් කරගන්නා බවට විවේචනයක් සමාජය තුළ පවතී. නමුත් සියල්ලන් එක සේ මනා සවිඥානිකත්වයත්වයෙන් යුක්ත ව සිටින සමාජයක් තුළ මෙකී තත්ත්වය අවම ය. මෙය අල්ලස, දූෂණය වැනි අපරාධවල දී මනා ව තහවුරු වන්නකි. එමෙන් ම මෙරට තුළ නිත්‍යානුකූල සමාජයේ දුර්වලභාවය කෙරෙහි ද නෛතික අනවබෝධය බලපෑම් සහිත ය.

නෛතික සවිඥානකත්වයක් ඇති කිරීම මඟින් අපරාධ පාලනය හා නිවාරණය වීම මෙන් ම නෛතික බලගැන්වීමේ සමාජයක් නිර්මාණය වීම යන අරමුණු සාධනය කරගත හැකි ය. මෙය එකවර ඇති කළ හැකි දෙයක් නො වන අතර නෛතික සවිඥානිකත්වය ඇති කිරීම දීර්ඝකාලීන වශයෙන් මෙරට අපරාධ පාලනය හා නිවාරණය සඳහා යොදාගත හැකි ප්‍රතිපත්තිමය වැඩසටහනක් බව අධ්‍යයනය අනුව නිගමනය වේ. ජාතිකමය වශයෙන් මේ පිළිබඳ ව අවධානය යොමු කරමින් වඩාත් සුදුසු පුද්ගලයින් හරහා මෙහෙයවීම සිදු කළ යුතු ය. අපරාධවලට නැඹුරු විය හැකි සමාජ කණ්ඩායම්, අපරාධ යුක්ති ක්‍රමය, ව්‍යවස්ථාදායකය යනාදි අංශ සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් නෛතික සාක්ෂරතාව සමස්ත ජනයා වෙත ම ගෙන යා යුත්තකි.

පොදු ජන නෛතික සවිඥානිකත්වයක් ඇති කිරීම ජාතික ප්‍රතිපත්තියක් ලෙස ගොඩනැගීම. එහි දී නෛතික සවිඥානිකත්වය අවධාරණය කරමින් ජාතික වශයෙන් මහජන නීති දැනුවත් කිරීමේ සැසි සහ සැමරුම් කාලයන් නම් කිරීම වැදගත් වේ. එමෙන් ම මෙරට පාසල් අධ්‍යාපනික විෂය නිර්දේශයන් යාවත්කාලීන කරමින් පාසල් අධ්‍යාපනය සඳහා නීති අධ්‍යාපනය ඇතුළත් කිරීම ඉතා සුදුසු ය. එහි දී දරුවන්ගේ දැනුම් මට්ටම් අනුව සරල ව ඉගැන්වීම් ප්‍රමාණීකරණය කිරීම, නීතිමය කාරණා සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබා දීම, විනයගරුක, සහතිකලත්, අතුරු නීති සුරකින්නන් ලෙස පාසල් සිසුන් ගොඩනැගීම සහ ඔවුන් සඳහා ශ්‍රේණිගත කිරීම් ලබාදීම වැනි ක්‍රමවේදයන් උපයෝගී කරගැනීම වැදගත් වේ.

ග්‍රාමීය වශයෙන් ප්‍රතිපත්ති සහ වැඩසටහන් උපයෝගී කරගනිමින් නෛතික සවිඥානිකත්වයක් ඇති කිරීම සඳහා ප්‍රජාවන්ගේ අධ්‍යාපනික හා දැනුම් මට්ටම් අනුව සුදුසු සම්මන්ත්‍රණ හා සුහද සාකච්ඡාවන් යොදා ගැනීම, ප්‍රජා පොලිස් සේවය, සිවිල් සමාජ සංවිධාන, රාජ්‍ය නො වන සංවිධාන සහ බලපෑම් කණ්ඩායම්, විශ්වවිද්‍යාල සිසුන් වැනි සමාජ ක්‍රියාකාරීන්ගේ සහභාගිත්වය මෙහි දී දිරිමත් කිරීම සුදුසු වේ. නෛතික සාක්ෂරතා වැඩසටහන් සැලසුම් කිරීමේ දී විවිධ කාරණා සම්බන්ධයෙන් බිම් මට්ටමේ සිට පුළුල් පරාසයක විහිදී යන මෙන් වැඩසටහන් සංවිධානය කළ යුතු අතර, ඉලක්කගත කණ්ඩායම් නිවැරදි ව හඳුනාගැනීම, වින්දිතභාවයට වැඩි ඉඩ-කඩක් ඇති සමාජ කණ්ඩායම් අවධාරණය කරමින් නෛතික සවිඥානිකත්වය ඇති කිරීමත්, එමෙන් ම කාන්තාවන් සහ ළමයින් සඳහා ම අවේණික වූ ඇතැම් නෛතික ගැටලු සම්බන්ධ දැනුවත්භාවය ව්‍යාප්ත කිරීමත්, වින්දිතභාවයට පත් වූ සමාජ කණ්ඩායම් කේන්ද්‍ර කරගනිමින් මානසිකමය උපදේශන සේවා, නීතිමය උපදේශන සේවා අනිවාර්ය කිරීම, ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යයන් හරහා නෛතික අවබෝධය ඇති වන අයුරින් නීතිමය ගැටලු පිළිබඳ තොරතුරු බෙදාහැරීම, එමෙන් ම ජනමාධ්‍යයන් හරහා සිදු කෙරෙන ප්‍රවෘත්ති විකාශන අතරතුර විනාඩි කිහිපයක කාලයක් යොදා ගනිමින් නෛතික අවබෝධය පිළිබඳ තොරතුරු ප්‍රවර්ධනය කිරීමත් සිදු කළ යුතු වේ. මෙම කාරණා ජාතිකමය වශයෙන් අවධාරණයට ලක් කරමින් වඩාත් සුදුසු පුද්ගලයින් හරහා මෙහෙයවීම සිදු කළ යුතු ය. මේවාට අමතර ව ප්‍රායෝගික නෛතික අධිකරණ ක්‍රියාදාමයන් පිළිබඳ ව අවබෝධයක් ලබා දීම ද යෝග්‍ය ය. අපරාධ නීති ආධාර සහ උපදේශනයන් ලබා ගැනීම සඳහා විකල්ප විසඳුම් ක්‍රමවේදයන් සුලභ ව ලබාගත හැකි පරිදි ස්ථාපිත කිරීම ද ඒ අතර වැදගත් වේ.

සාමාන්‍ය ජනතාවට මෙන් ම ව්‍යවස්ථාදායකයේ සියලු ම මැති-ඇමතිවරුන් සඳහා ද විධිමත් නෛතික සාක්ෂරතාවක් ලබා දීම නීති පැනවීමේ දී මතු වන බොහොමයක් ගැටලුවලට මෙන් ම රටේ අනාගත අභිවෘද්ධිය සඳහා ද ඉවහල් වනු ඇත. පනවන සෑම නීතියක් පිළිබඳ ව ම අපරාධ යුක්ති ක්‍රමය හා ඒ හා සම්බන්ධ ආයතන මෙන් ම රාජ්‍ය සේවකයන්ගේ ද දැනුවත් මට්ටම දියුණු කළ යුතු ය. මොවුන්ගේ දැනුමේ දුර්වලත්වය එම ආයතනවල නීති-රීති තවදුරටත් අකාර්යක්ෂම තත්ත්වයේ පැවතීමටත්, ඒවා නිසි පරිදි ක්‍රියාත්මක නො වීමටත්

බලපානු ඇත. මෙලෙස නෛතික සවිඥානිකත්වයෙන් යුත් සමාජයක් තුළ අපරාධ යුක්ති ක්‍රමයේ පවතින ගැටලු වාර්තා කිරීමට විවෘත සහ විනිවිදභාවයෙන් යුක්ත ස්වාධීන කොමිෂන් සභා ඇති කළ හැකි ය. එහි දී පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා සියලු ම සාමාන්‍ය ජනතාවට කොන්දේසි විරහිත ව අවස්ථාව සැලසිය යුතු වේ. මෙයට අමතර ව පනවන ලද නීති-රීති සහ ආයතනික විධි විධානයන් නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වන බවට සහතික කිරීම සුදුසු ය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


හරිස්චන්ද්‍ර, ආර්. (2013). *ශ්‍රී ලංකාවේ නීතිය.* මීගමුව, අකුර ප්‍රකාශකයෝ.

සම්පත් පැතිකඩ, (2018), රත්නපුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය.

Bevan, M. (2013). *Investigating young people's awareness and understanding of the criminal justice system.* Howard League for Penal Reform Sunley Prize winner. Retrieved from https://howardleague.org/wp-content/uploads/2016/06/Investigating-young-people-awareness-and-understanding-of-the-criminal-justice-system.pdf Date of accessed 2020/06/04.

Cooray, L. J. M. (1975). *Legal Education in Sri Lanka.* Malaya Law Review. Vol. 17, National University of Singapore (Faculty of Law). 117-135.

Dae-Ho, H., & Kim, M. A. (2015). *Public Legal awareness survey Research.* Korea legislation Research Institute. Retrieved from Public Legal Awareness Survey Research | Research Report | Publications | Korea Legal Research Institute KLRI (www-klri-re-kr.translate.goog) Accessed on 2020/05/30.

Ewick, P., & Silbey, S.S., (1998). *The Common Place of Law: Stories from everyday life.* University of Chicago Press. Retrieved from https://www.researchgate.net/publication/37692637_The_Common_Place_of_Law_Stories_From_Everyday_Life Accessed on 2020/05/30.

*Handbook on the crime prevention guidelines United Nation Document/S, (*2004). Retrieved from https://www.unodc.org/pdf/criminal_justice/Handbook_on_Crime_Prevention_Guidelines_-_Making_them_work.pdf Accessed on 3/12/2021.

Helmy, F.F., & et al. (2017). *Mother's Awareness about Different Types of Child Abuse in Taif Region*. Western KSA. Retrieved from https://www.semanticscholar.org/paper/Mother%E2%80%99s-Awareness-about-Different-Types-of-Child-Helmy-Aljiuad/6d74973cd36dc7af9dfc8fc24c719f4ad89e936f Accessed on 2020/06/07.

Kashyap, A. K. (2016). Professional Legal Education in India: Challenges and the Way Forward. Educational Quest. *An International Journal of Education and Applied Social Sciences,* Vol 7(3),141 - 147. India: Retrieved from http://www.ndpublisher.in.lk Accessed on 2022/04/18.

Kim B. & Park J. (2020). *Awareness of crime prevention effects associated with a wall removal project in Seoul.* China, Informa UK Limited.

Kozhukhova, M., & Zhiyenbayew M. (2018). *Conceptualizing legal Culture and Legal Awareness: Meaning and Structural Components*. Karaganda Kazakhstan, State Technical University Press.

Kulathunga, H. (2021). The need for basic Legal Education for Children as a school discipline. *Sunday Observer*. Retrieved from https://www-sundayobserver-lk.translate.goog/2021/12/12/news-features/need-basic-legal-education-children-school-discipline?_x_tr_sl=en&_x_tr_tl=si&_x_tr_hl=si&_x_tr_pto=op,sc Accessed on 15/05/2022.

Madhusanka, A.M. H. P. & Hewawasam, H. P. K. N. (2022). A Criminological Study on the Requirement to Introduce the Criminal Law into the Junior Secondary School Syllabus (Grades 6 to 9) in Sri Lanka (Based on Mahiyanganaya Education Zone). *Vidyodaya Journal of Humanities and Social Sciences, VJHSS* (2022), Vol. 07 (01). 10.31357/fhss/vjhss.v07i01.10 Retrieved from http://journals.sjp.ac.lk/index.php/vjhss/article/view/5530.

Marawan, H., & El-Sayed, D. (2013). Awareness and Experience of Sexual Harassment among Menoufiya University Students. *Asia Journal of Public Health*, Vol 4, 16-26. Retrieved from.https://www.researchgate.net/publication/338585173_Awareness_and_Experience_of_Sexual_Harassment_among_Menoufiya_University_Students Date of accessed 2020/06/02.

Marsh, N., McKay, E., Pelly, C., & Cereda, S. (2019). *Public Knowledge And Confidence In The Criminal Justice System And Sentencing. Sentencing Council*. Retrieved from https://www.sentencingcouncil.org.uk/wp-content/uploads/Public-Knowledge-of-and-Confidence-in-the-Criminal-Justice-System-and-Sentencing.pdf Accessed on 2020/06/04.

Mathews, B., & Collin-Vezina, D. (2016). *Child sexual abuse: Raising awareness and empathy is essential to promote new public health responses.* Macmillan Publishers Ltd. Retrieved from https://www.researchgate.net/publication/303037459_Child_sexual_abuse_Raising_awareness_and_empathy_is_essential_to_promote_new_public_health_responses Accessed on 2020/06/03.

Maxwell, R.C., Henning, J.F., & White, C. J. (1975). Law Studies in the Schools*. Journal of Legal Education,* 1975, Vol. 27 (2).

Mesko, G. (2009)' *Crime Policy" Crime Control .and Crime Preventions'* Slovenia, Slovenian Tipografija.

Michel, C., Cochran, J.K., & Heide, K.M. (2015). *Public knowledge about white-collar crime: an exploratory study. Crime Law Soc Change 65.* 67–91. Retrieved from https://www.researchgate.net/publication/288920108_Public_knowledge_about_white-collar_crime_an_exploratory_study Date of accessed 2020/06/04.

Mirabile, C. (2013). *A Comparison of Legal Literacy Among Teacher Subgroups.* Virginia Commonwealth University Scholar Compass. Retrieved from https://scholarscompass.vcu.edu/cgi/viewcontent.cgi?article=4194&context=etd Date of accessed 2020/06/05.

Muse, F.M. (2013). *Selected College Students' Perceptions, Knowledge and Awareness of Sexual Abuse of Children*. Cornerstone Minnesota State University. Retrieved from https://cornerstone.lib.mnsu.edu/cgi/viewcontent.cgi?article=1062&context=etds Date of accessed 2020/06/07.

Pevtsova, E., (2013). *The functions of legal awareness of children and young people*. Acta Universitatis George Bacovia Juridica. Vol 2. Retrieved from https://www.ugb.ro/Juridica/Issue22013/6._Functiile_constientizarii_juridice_a_copiilor_si_tinerilor.Elena_Pevtsova.EN.pdf Accessed on 2020/06/08.

Rathnayaka, R.M.K., (2015). Distribution Pattern of Urban Crimes in Sri Lanka: with Special Reference to Mirihana Police Division*. International Journal of Multidisciplinary Research and Development*. Retrieved from https://www.researchgate.net/publication/281202211_Distribution_Pattern_of_Urban_Crimes_in_Sri_Lanka_with_Special_

Reference_to_Mirihana_Police_Division Date of accessed 2021/12/18.

Silbey, S.S. (2005). *After Legal Consciousness*, *Annual Review of Law and Social Science*. First published online as a Review in Advance on August 19, 2005.

Sharma, S. (2016). Legal Literacy Growing Need of The Society*. An International Scholarly Research Journal.* Vol 4/26. 2758 – 2762.

The Economic and Social Council resolution Report, (2002). Action to promote effective crime prevention. *Economic and Social Council. 2002 /13*. Retrieved from https://www.unodc.org/documents/justice-and-prison-reform/crimeprevention/resolution_2002-13.pdf Accessed on 2022/05/22

Tripathi, P.K., (1968). In the Quest for Better Legal Education. *Journal of the Indian Law Institute,* Vol. 10(3). Published by Indian Law Institute.

UNODC - *The Doha Declaration promoting a culture of Law fullness*. Retrieved from https://www.unodc.org/e4j/en/secondary/criminal-justice.html Accessed on 3/4/2021

Zariski, A. (2011). *What is legal literacy.* Alhabasca, Alhabasca University Press' Zariski" A' (1992)' *Legal Literacy an Interdiction to Legal Studies*. Alhabasca, Alhabasca University Press.